cecb

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය




# 2017

# වාර්ෂික වාර්තාව

www.cecb.lk

2017

# වාර්ෂික වාර්තාව

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

# පටුන


| | |
|---|---|
| අපගේ තොරතුරු | 1 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 2 |
| සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවුඩය | 3 |
| මූල්‍යමය විශේෂතා | 4 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 6 |
| ඉකාමඋකා කළමනාකරණ කණ්ඩායම | 10 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 11 |
| විගණන කමිටු වාර්තාව | 13 |
| ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති | 15 |
| මූල්‍ය ප්‍රකාශන | |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 24 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 25 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 26 |
| සමකොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | 27 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 28 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 37 |
| ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන | 45 |
| ඉකාමඋකා කාර්ය සාධනය | 47 |
| මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම - මඉසේස | 69 |

ප්‍රබෝධයෙන්

# ඉලක්ක අභිබවා යමු

ඉකාමඋකා - ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය. ක්‍රියාකාරිත්වයෙන් බහු ආයතනික, ප්‍රවේශයෙන් පුරෝගාමී සහ, ඒ සියලු දේට ඉහළින් ඉදිරියට යෑමේ අභිලාශයෙන් යුත් අභිප්‍රේරිත වෘත්තිකයන් කණ්ඩායමකින් සැදුම්ලත් අග්‍රගණ්‍ය උපදේශන ආයතනයයි.

එම අභිප්‍රේරණය අතීතයත් සමඟින් පැමිණෙන්නකි - එම අතීතය දශක දෙකකටත් වඩා පෙර සිට මෙම දිවයිනෙහි මුහුණත නොමැකෙන සලකුණු රාශියක් තැබූ අතීතයකි: එම අතීතය, වර්තමාන සංවර්ධිත ලෝකය ආරම්භ වීමට පෙර වැජඹුණු අතීතයකි.

වාසනාවකට, එම නොමැකෙන සලකුණු එම දුරාතීතයේ දක්ෂ ඉංජිනේරුමය වික්‍රමයන්- ජීවය රහිත මෙවලම් මෙන් නොව අපගේ ශරීරයෙහි දිව යන යම් දෙයක් ලෙසින්...... අපව පෝෂණය කරමින්...... සහ අපගේ ආත්මයන්ට ජීවය ලබා දෙමින් තවමත් අප සමඟ පවතී.  තවද එය අප විසින් තෝරා ගෙන ඇති පුරුෂයින්ගේ සහ කාන්තාවන්ගේ අභිප්‍රේරණය වර්ධනය කරයි.

එවැනි අභිප්‍රේරණයන්ට ඉකාමඋකාහිදී අපි ජවය ලබා දෙන්නෙමු.

## අපගේ දර්ශනය

“ලෝක තත්ත්වයේ ඉංජිනේරු ආයතනයක් වීම ”

## මෙහෙවර

“මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රශස්ත ශුභ සිද්ධිය සඳහා සම්පත් උපරිම අයුරින් පරිහරණය කිරීම උදෙසා දක්වන ලද දායකත්වය වෙනුවෙන් අගයනු ලැබූ, ඉහළ අභිප්‍රේරණයක් සහිත පුහුණු හා දක්ෂ ශ්‍රම බලකායක් සමඟින් නූතන තාක්ෂණ විධික්‍රම යොදා ගනිමින් ඉංජිනේරුමය කාර්යයන්හි, ගෘහ නිර්මාණ සහ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය අත්පත් කර ගනිමින් ලෝක මට්ටමේ ඉංජිනේරුමය ආයතනයක් කරා ගමන් කිරීම”

# සභාපතිතුමාගේ පණිවුඩය



2017 මූල්‍ය වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (ඉකාමඋකා) වාර්ෂික වාර්තාව සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඉතා සතුටට පත් වන අතර එය මා ලැබූ ගෞරවයක්ද වේ. බාහිර තත්ත්වයන් හිතකර නොවූවද මූල්‍ය සහ මෙහෙයුම් වශයෙන් ප්‍රශංසනීය කාර්යසාධනයක් වාර්තා කිරීමට ලැබීම අපට ආඩම්බරයකි.

2016 වර්ෂයේ 4.5% සිට පහත වැටීමක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 3.1% දක්වා මන්දගාමී වී ඇති බව 2017 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ දැක්වේ. 2016 වර්ෂයේදී 8.5%ක වර්ධනය සමඟ සැලකීමේදී මැතිවරණ, අයහපත් කාලගුණය, උද්ධමන පීඩන වැනි බාහිර සාධක හේතුවෙන් ඉදිකිරීම් අංශය විසින් ජාතික ආර්ථිකයට වටිනාකම් එක් කිරීම 3.1% ක පහත වැටීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් මත සෘණාත්මක බලපෑමක් ඇති කරන ලද අතර රජයේ අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල උපදේශන හා ඉදිකිරීම් සේවා සඳහා විශාලතම සේවාදායකයෙකු ලෙස ඉකාමඋකා අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම ජාතික මන්දගාමීත්වය නොසලකමින් 2016 වර්ෂයේදී සාක්ෂාත් කර ගනු ලැබූ රු.බිලියන 11.7ට වඩා ආසන්න වශයෙන් 30%ක සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින් 2017 වර්ෂයේදී රු.බිලියන 15.2ක සමූහ ආදායමක් සාක්ෂාත් කර ගනිමින් එහි වර්ධන ගම්‍යතාවය පවත්වා ගැනීමට ඉකාමඋකා සමත් විය. කෙසේවෙතත්, ප්‍රධාන වශයෙන් අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, මහානගර සහ ඉදිකිරීම් කර්මාන්තයේ නව ව්‍යාපෘති සඳහා බඳවා ගන්නා ලද අතිරේක කාර්ය මණ්ඩලය, කුලී පදනම යටතේ වන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික වැටුප් වර්ධක සමඟ දැරීමට සිදු වූ පරිපාලන වියදම් වැඩිවීම හේතුවෙන් ජර්ඹ වටිනාකම 1.4%ක අඩුවීමක් පෙන්නුම් කරමින් 2017 වර්ෂයේදී රු. මිලියන 913.3ක් විය.

රජය සතු ව්‍යවසායක් ලෙස, රජය විසින් පනවා ඇති සියලු නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා අප දැඩි ලෙස බැඳී සිටී. සමුච්චිත බදු හා වෙනත් බදු වශයෙන් රජයට රු. මිලියන 361.1ක් ප්‍රේෂණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම සහිතව අඛණ්ඩව ඇගයීමට ලක් කරනු ලබන ශක්තිමත් පාලන සහ අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපනය කිරීම තුළින් පාලන සහ අධීක්ෂණ යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම සඳහා සියලු පියවර ගෙන ඇත.

ජාතික සංවර්ධන ක්‍රියාදාමයට සහයෝගය දැක්වීම සඳහා ඉකාමඋකා මේ වනවිට වඩාත් හොඳින් සූදානම් වී ඇති බව මම විශ්වාස කරමි. ඉකාමඋකා හි වාණිජ දිශානත ඉදිකිරීම් අංශය ලෙස මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (මඉසේස) වර්තමානයේදී ඉංජිනේරු ව්‍යාපෘති සඳහා විවෘත වෙළෙඳපොළ තරඟකාරී ලංසුකරණවල ඵලදායී සහභාගිත්වය සඳහා වෙළඳපොළ ස්ථානගත වී ඇත. පසුගිය වර්ෂ හතළිස් පහ තුළ ගොඩනගා ගත් බහු-විෂය වටිනාකම් ඉංජිනේරුමය කීර්තිනාමය සමඟින් උපදේශකත්වය සඳහා ඉකාමඋකා වෙළෙඳපොළ ප්‍රමුඛත්වය දරනු ලැබේ.

අවසාන වශයෙන් මාගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සිය වටිනා සහාය සහ උපදෙස් සඳහා මගේ කෘතඥතාව පළ කරමි, ඔහුගේ නායකත්වය හා කැපවීම සඳහා සාමාන්‍යාධිකාරීවරයාටත්, ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයටත්, විශේෂයෙන්ම අපගේ විශිෂ්ටතම වත්කම වන අපගේ කාර්ය මණ්ඩලය සහ පහළ මට්ටමේ සිට ඉහළ මට්ටම දක්වා වන සහායක කාර්ය මණ්ඩලයටත් විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි.



**ඉංජි. ජී.ඩී.ඒ.පියතිලක**
**සභාපති**

**BSc.Eng, PG.Dip (Const.Mgt), PG.Dip (Ports & Coastal) Norway, MIE (SL), C Eng, MASCE**

# සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය



සැලකිය යුතු ඉදිකිරීම් වෙළෙඳපොළ කොටසක් පවත්වා ගෙන යමින් දිවයිනෙහි ප්‍රමුඛතම ඉංජිනේරුමය උපදේශක ආයතනය ලෙස ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (ඉකාමඋකා) සිය ප්‍රමුඛස්ථානය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් මා ආඩම්බර වෙමි. ආරම්භයේ සිටම ජාතික යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීමෙන් පමණක් නොව විශේෂයෙන් අපගේ වෙළෙඳපොළ ස්ථානගත වීම සඳහා  අවශ්‍ය වන ජාතික ඉංජිනේරුමය කුසලතාවයන් හා මානව සම්පත් සංචිතයක් ගොඩනැඟීම සඳහා ආයෝජනය කිරීම මඟින් ඉකාමඋකා මෙම උපාය මාර්ගික තත්ත්වය සාක්ෂාත් කරගෙන ඇත.

සභාපතිතුමා විසින් ඔහුගේ පණිවුඩයෙහි සඳහන් කර ඇති පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රය කෙරෙහි බලපෑම් ඇති කරමින් දිවයිනෙහි පවතින ආර්ථික මන්දගාමිත්වය මධ්‍යයේ වුවද, සමස්ත ලාභදායීත්වය අනුව අප සමායන කාර්යසාධනයක් අත්පත් කර ගෙන තිබේ. ඉකාමඋකා සමූහ ආදායම් උත්පාදනය 2016 වර්ෂයට වඩා 2017 වර්ෂය තුළ දී 30% වැඩිවීමක් පෙන්නුම් කරන අතර, වරාය නගර සංවර්ධන, මධ්‍යම සහ දකුණු අධිවේගී මාර්ග,  ජල සම්පත් ව්‍යාපෘති ආදිය සඳහා අත්දැකීම් සහිත ඉංජිනේරු විශේෂඥයින් සහ වෙනත් තාක්ෂණික ශිල්පීන් කිහිප දෙනෙකුගේ සේවය බාහිරව ලබා ගැනීමට සිදු වීමෙන් පරිපාලන වියදම්වල වැළැක්විය නොහැකි වැඩි වීමක් සිදු වීමෙන් ලාභාන්තික සඳහා බලපෑමක් ඇති විය. මෙම කාල පරිච්ඡේදය තුළ උපදේශන අංශය විසින් යහපත් වර්ධනයක් පවත්වාගෙන ගිය අතර 2017 වර්ෂය තුළදී රුපියල් බිලියන 2.43ක ආදායමක් උත්පාදනය කරන ලද අතර එම කාලසීමාව තුළදී ඈජක අංශය රු. බිලියන 10.8ක ආදායමක් වාර්තා කළේය.

මධ්‍යම හා දකුණු අධිවේගී මාර්ග, වරාය නගර සංවර්ධන සහ ජල සම්පත් හා ජල විදුලි ව්‍යාපෘති කිහිපයක් වන කළුගඟ, උමා ඔය සහ බ්‍රෝඩ්ලන්ඩ් වැනි ජාතික වැදගත්කමකින් යුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වටිනාකම් ඉංජිනේරු උපදේශන ලබා දීම තුළින් ස්වයං ආදායම් උත්පාදනය කරනු ලබන රජය සතු ව්‍යවසායක් ලෙස කාර්යාංශය ජාතික ආර්ථිකය සඳහා එහි විශේෂ දායකත්වයක් දක්වමින් සිටී.

අපගේ සියලුම නියාමන කැපවීම් සම්පූර්ණයෙන් සපුරාලන අතරම රටේ ඉංජිනේරුවන් හා අනෙකුත් වෘත්තිකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහා රැකියා අවස්ථා ලබා දීමෙහි කාර්යාංශය අඛණ්ඩව නියැලී සිටී.

ඉකාමඋකා විසින් එහි තරඟකාරීත්වය පවත්වාගෙන යාම සඳහා පුහුණුව හා නිපුණතා සංවර්ධනය ඉතා වැදගත් වන බව හඳුනාගෙන ඇත. ඉකාමඋකා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ විදේශීය පුහුණු අවශ්‍යතා ඇතුළුව අභ්‍යන්තර, පශ්චාත් උපාධි, වෘත්තීය සමාලෝචන පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා 2017 වර්ෂයේදී ඉකාමඋකා විසින් රු. මිලියන 9.8ක් ආයෝජනය කරන ලදී. ඔවුන්ගේ ඉකාමඋකා වෘත්තීය ජීවිතයේ පුද්ගල වර්ධනයට අවස්ථාව සලසමින් ඔවුන්ගේ කුසලතාවයන් සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අප අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු. විශ්වවිද්‍යාල 10ක සහ කාර්මික/වෘත්තීය පුහුණු ආයතන 07ක ශිෂ්‍යයන් 602ක් සඳහා නොමිලේ කාර්මික පුහුණු අවස්ථා ලබාදීම තුළින් ඉකාමඋකා ජාතික ඉංජිනේරු අධ්‍යාපනය සඳහාද දායකත්වය දක්වා ඇත.

හරිත ගොඩනැගිලි මුලපිරීම් පිළිබඳ අපගේ අවධානය මෙන්ම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (කෂඅ), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ශ්‍රීප්‍රආ) සහ වෙනත් වෘත්තීය හා නියාමන ආයතන සඳහා ලබා දුන් තාක්ෂණික සහයෝගය, රට තුළ පාරිසරක තිරසරභාවය පවත්වාගනිමින් ඉංජිනේරුමය ප්‍රමිත පවත්වා ගෙන යාම සහ නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට උපකාරී වී ඇත. අපගේ සමාජ වගකීම්වල කොටසක් ලෙස, ආයතනික සමාජ වගකීම් මුලපිරීමක් වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ වැඩි අවධානයක් යොමු වී නොමැති පාසල් කිහිපයක් සඳහා නව සනීපාරක්ෂක පහසුකම් සපයා දී ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉකාමඋකා වෙත ලැබී ඇති ගෞරවයට සහ පිළිගැනීම ඉහළ නැංවීමට නායකත්වය සැපයීම සඳහා සභාපතිතුමා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හා සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් ලැබුණු සහයෝගය පිළිගනිමින් මෙම සටහන අවසන් කිරීමට කැමැත්තෙමි. 2017 වර්ෂය ඵලදායී වර්ෂයක් බව සැලකිය යුතු කරුණකි. අපගේ ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වූ අතර, ඉදිරි වර්ෂවල අපේ අනාගත අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට ධනාත්මකව මඟ බලා සිටින්නෙමු.



**ඉංජි. කේ.එල්.එස්.සහබන්දු**
**සාමාන්‍යාධිකාරී**

**Bsc.Eng (Hons), PG Dip (Hyd), MSc.(Struct.),CEng, MICE (London),MIE (SL), M.Cons E(SL), FSSE (SL)**

# මූල්‍යමය විශේෂතා

| | ඉදිකිරීම් | | මඉඋකා | |
|---|---|---|---|---|
| | 2017 රු.මි | 2016 රු.මි | 2017 රු.මි | 2016 රු.මි |
| ඉදිකිරීම් ආදායම | 12,807 | 9,563 | 10,769 | 8,209 |
| උපදේශන ආදායම | 2,403 | 2,112 | 2,427 | 2,124 |
| ඒකාබද්ධ ආදායම | 15,210 | 11,675 | 13,196 | 10,333 |
| දළ ලාභය | 1,897 | 1,821 | 1,120 | 1,153 |
| බදු පෙර ශුද්ධ ලාභය | 915 | 926 | 757 | 816 |
| බදු පසු ශුද්ධ ලාභය | 522 | 524 | 401 | 440 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | 516 | 545 | 395 | 460 |
| මුළු වත්කම් | 23,302 | 19,945 | 21,856 | 18,434 |
| දායක ප්‍රාග්ධනය | 0.50 | 0.50 | 0.50 | 0.50 |
| මුළු සමකොටස් | 6,016 | 5,501 | 5,603 | 5,208 |
| මුළු සමකොටස් සමතුලිතතාවය | 23,302 | 19,945 | 21,856 | 18,434 |
| ජංගම වත්කම් | 20,398 | 17,001 | 19,422 | 15,878 |
| ජංගම බැරකම් | 17,097 | 14,265 | 16,092 | 13,069 |

# සමූහයේ මූල්‍යමය විශේෂතා



# මූල්‍යමය විශේෂතා

ආදායම (රු.මි.)




ශුද්ධ ලාභය (රු.මි.)




වෙනත් ආදායම් (රු.මි.)




ශුද්ධ මූල්‍ය ආදායම (රු.මි.)




ජංගම වත්කම් සහ ජංගම බැරකම් (රු.මි.)




මුළු සමකොටස් (රු.මි.)




ලාභ අනුපාතික



# අධ්‍යක්ෂ මණ්ඩලය

ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා
**සභාපති**

ඉංජි. එන්. රූපසිංහ මහතා
**අධ්‍යක්ෂ**






පී.බී.එස්.සී. නෝනිස් මහතා
**අධ්‍යක්ෂ**

එස්.එම්.එන්.එල්. සේනානායක මහතා
**අධ්‍යක්ෂ**

ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා

අධ්‍යක්ෂ

එම්.ආර්.පී. රණතුංග මහතා

ක්‍රියාකාරී අධ්‍යක්ෂ



ඉංජි. එච්.බී. ජයසේකර මහතා

අධ්‍යක්ෂ



## ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා

**සභාපති**

**BSc.Eng.Hons, PG. Dip. (Const.Mgt), PG. Dip. (Port & Coastal Eng.) Norway, MIE(SL), CEng., MASCE**

2015 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලදී. සමගාමීව මඉඋකා හි ඉදිකිරීම් ඉංජිනේරු අංශය වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාග මේ සභාපති වශයෙන්ද කටයුතු කරයි. 2010 වර්ෂයේ සිට ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) ලෙස එහි කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජු සහය ලබා දෙන ලදී. සම්පූර්ණයෙන්ම මඉඋකා හිදී විවිධ තනතුරු හොබවමින් අත්පත් කර ගන්නා ලද වසර 34ක ඉංජිනේරුමය හා කළමනාකරණ පෘථුල පළපුරුද්දක් ඇති අතර 1983 වසරේදී වික්ටෝරියා ජලවිදුලි ව්‍යාපෘතියේ නේවාසික ඉංජිනේරුවෙකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කර, ව්‍යාපෘති ඉංජිනේරුවෙකු ලෙස (1995) ව්‍යාපෘති කණ්ඩායම් නායකයෙකු (1996), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (2005) සහ 2010 වර්ෂයේදී අතිරේක සාමාන්‍යාධිකාරී වශයෙන් ගත වූ වර්ෂවලදී ඉහළ යන වගකීම් සහ උසස්වීම් ලබා ගෙන ඇත. ඔහුගේ දිගුකාලීන වෘත්තීය ජීවිතයේදී භාරගත් විවිධාකාර ව්‍යාපෘති කළමණාකරනය කිරීම තුළින් උකහාගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුම සහ පුළුල් විශේෂඥතාවය අධ්‍යක්ෂ මණ්ඩලය කරා ගෙන ගොස් ඇත.

---

## එම්.ආර්.ජී. රණතුංග මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

**LL.B (Sri Lanka), Attorney-at-Law, Notary Public, Company Secretary, Actg. Magistrate.**

2015 වර්ෂයේදී ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. මීට පෙර වර්ෂ 2007 සිට 2010 දක්වා කාලය තුළ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස මඉඋකා හි සේවය කළේය. එසේම ඔහු සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (පෞද්.) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. වර්තමානයේදී අධ්‍යක්ෂ, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ, ආරක්ෂක අමාත්‍යාංශය, ලේකම්, රක්නා ලංකා (පෞද්.) සමාගම ලෙසද කටයුතු කරයි. මීට පෙර අධ්‍යක්ෂ, ජල සම්පත් මණ්ඩලය සහ අධ්‍යක්ෂ, පොහොර සංස්ථාව යන තනතුරු හොබවා ඇත. මුලින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ උතුරු මැද පළාතේ කලාපීය උප සභාපති ලෙසද කටයුතු කර ඇත.

---

## ඉංජි. එන්. රූපසිංහ මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

**BSc. Eng.(Hons),PG Dip. (Hydropower)Norway, C.Eng.,MIE (SL), MICE (London), Licd. Surveyor**

2015 වර්ෂයේදී අධ්‍යක්ෂවරයෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. 2015 වර්ෂයේ සිට මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ජාතික වැදගත්කමකින් යුත් සංවර්ධන වගකීම් දරයි. වර්ෂ 2005 සිට 2014 දක්වා මඉඋකා හි සභාපතිවරයා ලෙස සේවය කරන ලදී. 1981 දී සිවිල් ඉංජිනේරුවකු ලෙස මඉඋකා ට සම්බන්ධ වී සිවිල් ඉංජිනේරුවෙකු, නේවාසික ඉංජිනේරුවරයෙකු, ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරයෙකු, ව්‍යාපෘති කළමනාකරුවෙකු, අතිරේක සාමාන්‍යාධිකාරී සහ සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කර වර්ෂ 34කට වඩා වැඩි පෘථුල ඉංජිනේරුමය සහ කළමනාකරණ පළපුරුද්දක් කාර්යාංශය තුළින් ලබා ගෙන ඇත. ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (**EPC**) අංශය ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරු (යටිතලව්‍යුහ ඉදිකිරීම්) සහ අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස (**EPC**) ලෙස පුරෝග ාමී මෙහෙවරක නිරත විය.

---

## ඉංජි. එච්.බී. ජයසේකර මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

**BSc.(Eng.), C.Eng., MICE(UK), FIE(SL)**

2015 වර්ෂයේදී අධ්‍යක්ෂවරයෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. වර්ෂ 2000 සිට 2004 දක්වා මඉඋකා හි සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත. දේශීයව ජාතික මට්ටමින් සහ විදේශගතව ඉංජිනේරුමය හා කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සැලසුම් ඉංජිනේරු ලෙස (1965 සිට 1967) දක්වා නේවාසික ඉංජිනේරු ලෙස (1967-1968) දක්වා සහ නේවාසික ඉදිකිරීමේ කළමනාකරු ලෙස (1970 සිට 1972) සේවය කර ඇත. වර්ෂ 1977 දී ප්‍රධාන ව්‍යාපෘති ඉංජිනේරු ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට සම්බන්ධ වී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (1978-1986), අතිරේක සාමාන්‍යාධිකාරී, ජල සම්පත් හා සැලසුම් (1986-1995) ලෙස උසස්වීම් ලබා වර්ෂ 1995 සිට 1996 දක්වා සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරන ලදී. එක්සත් රාජධානියේ වන සංරක්ෂණ කොමිෂන් සභාවේ, ප්‍රධාන කාර්යාලයේ වර්ෂ 1968 සිට 1970 දක්වා සේවය කරන ලද අතර එක්සත් රාජධානියේ කෙන්ට් ප්‍රාන්ත කවුන්සිලයේ නියෝජ්‍ය අංශ ඉංජිනේරු ලෙස වර්ෂ 1972 සිට 1977 දක්වා සේවය කර ඇත.

## එස්.එම්.එන්.එල්. සේනානායක මහතා

**අධ්‍යක්ෂ**

**BSc., Dip. Mgt., FCA, Chartered Accountant.**

2004 සිට මඉලකා හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර, 2015 වර්ෂයේ සිට අධ්‍යක්ෂවරයෙකු ලෙස ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට නැවත පත්කර ඇත. මධ්‍යම ඉංජිනේරු සේවා (**PVT**) සමාගමේ, සමාගම් ලේකම් ලෙස කටයුතු කරන ලදී. පුළුල් මූල්‍ය කළමනාකරණය සහ ගිණුම්කරණ අත්දැකීම් සහිත වේ. වර්ෂ 1988 සිට කෝපරේට් විෂන් (පෞද්.) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සහ වර්ෂ 1994 සිට ෆයිනෑන්ෂල් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (පෞද්.) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

---

## පී.බී.එස්.සී. නෝනිස් මහතා

**අධ්‍යක්ෂ**

**B.Sc. (Business Admin) Hons – University of Sri Jayawardenapura, Master of Public Administration – Flinders University Australia, LICA Institute of Chartered Accountants of Sri Lanka**

මඉලකා හි අධ්‍යක්ෂ මණ්ඩලය තුළ භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයෙකු ලෙස 2015 දී පත් කර ඇති අතර **CECB** හි විගණන කළමනාකරණ කමිටුවේ වත්මන් සභාපතිවරයා ලෙස කටයුතු කරයි. මුදල් අමාත්‍යාංශයේ සහ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ නිත්‍ය අධ්‍යක්ෂ තනතුරක් දරයි. විවිධාකාර හා පුළුල් ශ්‍රී ලංකා පරිපාලන සේවා (**SLAS**) අත්දැකීම් සහිත වේ. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ සහකාර ලේකම් (1998) ලෙස **SLAS** වෘත්තීය ජීවිතය ආරම්භ කර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (2002), වෙළඳ තීරුබදු හා ආයෝජන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (2009) සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස (2009) සහ 2011 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලද අතර, 2014 වර්ෂයේදී ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ලෙස පත් කරන ලදී. 2014 වර්ෂයේදී යවන හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ, නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහනෙහි වෘත්තීය මාර්ගෝපදේශ විශේෂඥයකු ලෙස කටයුතු කර ඇත.

---

## ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා

**අධ්‍යක්ෂ**

**B.Sc. Eng, C Eng, MICE (UK), MIE (SL)**

2016 වර්ෂයේදී අධ්‍යක්ෂවරයෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ අතර සමගාමීව මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමේ විධායක අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරනු ලැබේ.2016 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කරන ලදී. 1980 වර්ෂයේදී සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට සම්බන්ධ වී මාදුරුඔය වාරිමාර්ග සහ ජල විදුලි ව්‍යාපෘතියේ වැඩබිම් ඉංජිනේරුවරයා ලෙසද, කැනියොන් ජලවිදුලි ව්‍යාපෘතියේ සැලසුම් ඉංජිනේරුවරයා ලෙසද, සමනලවැව ජලවිදුලි ව්‍යාපෘතියේ ප්‍රධාන ඉංජිනේරුවරයා ලෙසද සේවය කරන ලද අතර කාර්යාංශය තුළ වසර 36කට වඩා වැඩි පුළුල් ඉංජිනේරු සහ කළමනාකරණ පළපුරුද්දක් සතු ඉංජිනේරුවරයෙකි. 2001 වර්ෂයේදී ව්‍යාපෘති කළමනාකාරවරයෙකු ලෙස ඔහු ජාත්‍යන්තර - දකුණු පළාත් කොටස ආරම්භ කරන ලද අතර 2006 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (**EPC-SP**) ලෙසද, 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අතිරේක සාමාන්‍යාධිකාරී (**EPC**) ලෙස සහ 2016 සැප්තැම්බර් මස දක්වා ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී ලෙසද කටයුතු කරන ලදී.

# කළමනාකරණ කණ්ඩායම

ඉංජි. පී.ඩී.ඒ.පියතිලක
සභාපති

ඉංජි. කේ.එල්.එස්.සහබන්දු
සාමාන්‍යාධිකාරී

ඉංජි. ටී.ඩී.වික්‍රමරත්න
ඒකාබද්ධ සාමාන්‍යාධිකාරී (උපදේශන)

ඉංජි. ඒ.ගල්කැටිය
ඒකාබද්ධ සහකාරසාමාන්‍යාධිකාරී(EPC)
සහකාර සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති-2)

---

ඉංජි. පී.ඩී.ඒ.පියතිලක
සහකාර සාමාන්‍යාධිකාරී (EPC-WP-1)

ඉංජි. ඊ.පී.යූ.එස්.කරුණාරත්න
සහකාර සාමාන්‍යාධිකාරී (EPC-බස්නාහිර පළාත-2)

ඉංජි. අයි.ආර්.පී.ගුණතිලක
සහකාර සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති-1)

ඉංජි. එච්.එම්.නන්දසේන
සහකාර සාමාන්‍යාධිකාරී (EPC-මධ්‍යම පළාත)

ගෘහ නිර්මාණශිල්පී ඩබ්ලිව්.කේ.ලලිත් හේවගේ
සහකාර සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණාත්මක)

ඉංජි. පී.ඒ.ඩී.එල්.ජේ.සෙනෙවිරත්න
සහකාර සාමාන්‍යාධිකාරී (විදුලි සහ යාන්ත්‍රික)

ඉංජි. එච්.එම්.එස්.රූපසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත)

ඉංජි. එස්.ඩබ්ලිව්.ජයවර්ධන
සහකාර සාමාන්‍යාධිකාරී (නිර්මාණ-1)

ඉංජි. ඒ.ඒ.පී.අදිකාරි මිය
සහකාර සාමාන්‍යාධිකාරී (Design-2) / සහකාර සාමාන්‍යාධිකාරී(DHQC)

ඉංජි. එස්.ඒ.යූ.ඩී.සී.සිරිවර්ධන
සහකාර සාමාන්‍යාධිකාරී (ජල සම්පත් සැලසුම්)

ඉංජි. පී.එම්.පී.සී.ගුණතිලක
අති./සහකාර සාමාන්‍යාධිකාරී (EPC-නැගෙනහිර)

ඉංජි. පී.ආර්.ඒ.එස්.ගුණතිලක
සහකාර සාමාන්‍යාධිකාරී (උපදේශන-නැගෙනහිර)

ඉංජි.ඩබ්ලිව්.ඒ.ඩී.ඩී.නන්දකුමාර
සහකාර සාමාන්‍යාධිකාරී (උතුරු මාර්ග)

ඉංජි. එම්.එන්.ගුණසේන
සහකාර සාමාන්‍යාධිකාරී (EPC-ඌව පළාත)

ඉංජි. ටී.ජී.ඩී.ටී.ධර්මවර්ධන
සහකාර සාමාන්‍යාධිකාරී (Projects)

ඉංජි. ඩබ්ලිව්.ඊ.පී.රන්ජන්කුමාර
අති./සහකාර සාමාන්‍යාධිකාරී (EPC-සබරගමුව)

ඉංජි. පී.එම්.පී.සී.ගුණතිලක
අති./සහකාර සාමාන්‍යාධිකාරී (EPC-ගිණිකොණ)

ඉංජි. එස්.එස්.ඒ.කලුගල්දෙනිය
අති./ සහකාර සාමාන්‍යාධිකාරී (නිර්මාණ-3)

ඉංජි. ජේ.ඒ.ඩී.ආර්.එස්.කුමාර
අති./ සහකාර සාමාන්‍යාධිකාරී (EPC-උතුරු මැද)

ඉංජි. ඒ.පුෂ්පරාජා
අති./ සහකාර සාමාන්‍යාධිකාරී (EPC-උතුර)

ඉංජි. ඒ.ඒ.විරාජ් ඩයස්
සහකාර සාමාන්‍යාධිකාරී (NRM)LS)

ඩබ්ලිව්.ටී.ඩී.පී.පත්මේන්ද්‍ර මයා
අති./නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (C&QS)

ඉංජි. එස්.බී.ඒ.ඩී.සේමසිංහ
අති./සහකාර සාමාන්‍යාධිකාරී (EPC-පොළොන්නරුව)

ඉංජි. එල්.ඩබ්ලිව්.ජේ.එන්. ද අල්විස්
අති./සහකාර සාමාන්‍යාධිකාරී (EPC-දකුණු පළාත)

---

යූ.එන්.බී.මාවතගම මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -මුදල්

ඒ.සී.ජයතිලක මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - IT

ඊ.ආර්.එස්.අමරසේකර මයා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

එස්.එච්.එච්.සී.යූ.සේනානායක මිය
අති./ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී

එල්.පී.ජයසුන්දර මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මා.සම්. සහ පරිපාලන )

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2017

## නීතිමය තත්ත්වය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (මඉඋකා), ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහු-විෂය උපදේශන සේවාවන් සැපයීම සඳහා වර්ෂ 1973 අප්‍රේල් මස 10 වැනි දින පිහිටුවන ලදී. එය වර්ෂ 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ  පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

මහජන සම්පත්වල භාරකාරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය එයට පවරා ඇති අයිතීන් සහ වගකීම් ඒකාබද්ධව සහ විශ්වාසනීයව ඉටු කළ යුතුය. නිසි සැලසුමකින් තොරව සිදුකරන ඕනෑම තීරණ හා ක්‍රියාවන් හේතුවෙන් අවසානයේ දී මහජනයා විසින් විශාල වශයෙන් වන්දි ගෙවිය යුතු වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම සිය භාරදූර වගකීම් පිළිබඳව විමසිලිමත් විය යුතුය.

## යහ භාවිතයන්

ව්‍යවසායේ යහපත වෙනුවෙන් උපායශීලී තීරණ විවෘතව හා නිර්මාණාත්මකව විවාද කරනු ලබන සුපරික්ෂාකාරී සහ හොඳින් ක්‍රියාත්මක වන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ඒකාබද්ධ පාලනයෙහි යහ භාවිතයන් විසින් මඟ පෙන්වනු ඇත. මේ සඳහා සාමාජිකයන්ගේ මතභේදකාරී අදහස් ද සවන් දිය යුතුය. එක් විසංතිකයෙකුට මණ්ඩලයක් මත විශාල වෙනසක් සිදු කළ හැකි ය. "ඉහළම කාර්ය සාධනයක් සහිත සමාගම් විසම්මුතිය වගකීමක් ලෙස සලකන සහ කිසිදු කරුණක් සාකච්ඡා කළ නොහැකි යැයි නොසලකන අතිශයින් විවාදාත්මක අධ්‍යක්ෂ මණ්ඩලයන්ගෙන් සමන්විත වේ".

## නායකත්ව කාර්ය භාරය

**a)**  ව්‍යවසායේ මෙහෙවර සහ එහි කොටස් හිමියන්ගේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සේවය කළ හැකි හොඳම ආකාරය නිර්ණය කිරීම.

**b)** නීතිමය අවශ්‍යතා සපුරා ඇති බව සහ සංස්ථාගත කිරීමේ පනතේ ව්‍යවස්ථාවේ සහ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව ව්‍යවසායෙහි මෙහෙයුම් කටයුතු සිදු වන්නේද යන්න සහතික කිරීම.

**c)** සිය කොටස් හිමියන් හා අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රශස්ත ප්‍රතිඵල ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස කළමනාකරණය විසින් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිපත්ති රාමුගත කිරීම.

**d)** අනාගත වර්ධනය සඳහා දිගුකාලීන අභිමතාර්ථ සහ අරමුණු සම්පාදනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රත්තිමය අරමුණු වරින්වර සමාලෝචනය කර උපාය මාර්ගික උපදෙස් සැපයීම.

**e)** ව්‍යවසායේ සුමට ක්‍රියාකාරිත්වය උදෙසා  අභිමතාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් බාධාවලින් තොරව කාලානුරූපී පදනමකින් උත්පාදනය කිරීම හෝ ලබා ගැනීම හෝ තහවුරු කිරීම.

**f)** ප්‍රමාණවත් වාර්තා සහ ගිණුම් පවත්වාගෙන යාමෙන් නිසි වගවීම සහතික කිරීම

**g)** බාධා කිරීම්, පසුබෑම් ආදියෙන් ව්‍යාපාරයට සිදුවිය හැකි වැළැක්වීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම ආදිය.

## අධීක්ෂණ කාර්ය භාරය

එහි අධීක්ෂණ ක්‍රියාකලාපය පිළිබඳව සැලකීමේදී ව්‍යවසායේ සමස්ත කළමනාකරණය සඳහා සහ වගකීම් ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් අතර පුළුල්ව බෙදාගත් ඵලදායී පාලන පද්ධති ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වනුයේ:

**a)**  ආයතනයේ සහ වැඩි වශයෙන් මහජනතාවගේ යහපත උදෙසා සහ ඒවා රාමු ගත කර ඇති අදහසින්ම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන බවට වග බලා ගැනීම.

**b)** ව්‍යවසාය එහි මෙහෙයුම් කටයුතු නිවැරදිව සිදු කරනු ලබන්නේද යන්න පිළිබඳව වග බලා ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු වාර්තා සහ කාර්ය සාධනය ඇගයීම මඟින් කළමනාකරණයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.

**c)**  ප්‍රතිඵල, අපේක්ෂිත අපේක්ෂාවන් සමඟ නොගැළපෙන්නේ නම්, අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමේ පියවර ගැනීම.

**d)**  කළමනාකරුවන් ලෙස දක්ෂ පුද්ගලයන් පත් කිරීම සහ ස්වාධීනව හා වගකිවයුතු ලෙස සිය කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු පරිසරයක් ලබා දීම තුළින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර නිසි බලය පැවරීම සහ කණ්ඩායම් හැඟීමක් ඇති බවට වගබලා ගැනීම.

**e)** වාර්ෂික මහා සභා රැස්වීම්වලදී කොටස්කරුවන්ට වාර්තා කිරීම/පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (**COPE**) රැස්වීම්වලට සහභාගී වීම.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ සභාපතිවරයා ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත පරිදි වේ;

- ඉංජි. ජී.ඩී.ඒ.පියතිලක මහතා - සභාපති
- එම්.ආර්.පී. රණතුංග මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
- ඉංජි. එන්. රූපසිංහ මහතා - අධ්‍යක්ෂ
- එස්.එම්.එන්.එල්. සේනානායක මහතා - අධ්‍යක්ෂ
- ඉංජි. එච්.බී. ජයසේකර මහතා - අධ්‍යක්ෂ
- පී.බී.එස්.සී. නෝනිස් මහතා - අධ්‍යක්ෂ
- ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා - අධ්‍යක්ෂ

## රැස්වීම් සහ පැමිණීම

2017 මූල්‍ය වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 13ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

| නම | තනතුර | 2017 | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජන 30 | පෙබ 23 | මාර්තු 27 | අප්‍රේල් 27 | මැයි 24 | ජුනි 15 | ජුනි 22 | ජූලි 27 | අගෝ. 25 | සැප් 28 | ඔක්. 26 | දෙසැ. 11 | දෙසැ. 28 |
| ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා | සභාපති | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| එම්.ආර්.පී. රණතුංග මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඉංජි. එන්. රූපසිංහ මහතා | අධ්‍යක්ෂ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| එස්.එම්.එන්.එල්. සේනානායක මහතා | අධ්‍යක්ෂ | - | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ | ✓ |
| ඉංජි. එච්.බී. ජයසේකර මහතා | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | - | - | - | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ |
| පී.බී.එස්.සී. නෝනිස් මහතා | අධ්‍යක්ෂ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

# විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක **PED** 55 අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරන ලද විශේෂිත යොමු කිරීමේ අනුදේශ (ඔධසා) මඟින් විගණන සහ කළමනාකරණ කමිටුව පාලනය වේ. යොමු කිරීමේ අනුදේශ සහ රජයේ අවශ්‍යතාවය අනුව එහි වගකීම් ඉටු කිරීමේ අරමුණු කෙරෙහි කමිටුව අවධානය යොමු කර සිටී. අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට සහ වෙනත් අදාළ නීතිමය අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය වාර්තාකරණය සිදුවන බව සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය භාරයට සහායවීමේ වගකීම විගණන කමිටුව විසින් දරනු ලැබේ. තවද, අඛණ්ඩ සමාලෝචනය, නිරීක්ෂණ කිරීම, නොගැළපීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ ඉදිරිපත් කිරීම මඟින් රජය විසින් නිකුත් කරනු ලබන  අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛ සියල්ල අනුගමනය කරනු ලබන බව  සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. විගණන කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපිලේඛන **COPE** නිර්දේශයන් සමාලෝචනය කළ යුතු වන අතර ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. ඊට අමතරව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. කාරක සභාව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්විය යුතු වන අතර, ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා එහි නිර්දේශයන් එම රැස්වීමෙහි කාර්ය සටහන් සමඟ ඉන් පසුව හැකි ඉක්මනින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. විගණන කමිටුවේ යොමු කිරීමේ අනුදේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, ආයතනයේ සියලු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද සමාලෝචනය කිරීම නිශ්චය කිරීම, පිරිවැය ඵලදායිත්වය සඳහා සහ නාස්තිකාර වියදම් ආදිය බැහැර කිරීම සඳහා ඒකාකාර කාල අන්තරයන්ගෙන් කාර්ය සාධනය සමාලෝචනය කිරීම, බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම සහ විගණකාධිපතිවරයාගේ/බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි අනුව කටයුතු කිරීම, ව්‍යවස්ථා, රෙගුලාසි සහ චක්‍රලේඛවලට අනුකූල වන්නේද යන්න  නිශ්චය කිරීම, ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වන බව සහතික කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම, රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ උපදේශක කාරක සභාවේ නිර්දේශ/මඟපෙන්වීම් ක්‍රියාවට නැංවීම සමාලෝචනය කිරීම, වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කිරීම, ව්‍යවසාය සතු අනුබද්ධිත ආයතන තිබේ නම්, ඒවාට අදාළ ගැටලු නිරන්තරයෙන් නිරාකරණය කිරීම.

### සංයුතිය

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක **PED** 55හි විධිවිධාන ප්‍රකාරව, කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන භාණ්ඩාගාර නියෝජිතවරයාද ඇතුළුව කාර්යාංශයේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වේ.

- පී.බී.එස්.සී. නෝනිස් මහතා - අධ්‍යක්ෂ/කමිටුවේ සභාපති
- එස්.එම්.එන්.එල්. සේනානායක මහතා - අධ්‍යක්ෂ
- ඉංජි. එච්.බී. ජයසේකර මහතා - අධ්‍යක්ෂ

මූල්‍ය හා කළමනාකරණ විශේෂඥතාවය සමඟ කමිටුවට වාණිජ හා රාජ්‍ය අංශයෙහි සම්මිශ්‍රණය වූ පළපුරුද්දක් ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් එස්.එච්.එච්.සී.යූ. සේනානායක මෙය විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක ජේ.එම්.බී. ජයවීර මහතා විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරන ලදී.

### රැස්වීම් සහ ඒ සඳහා පැමිණීම

විගණන කමිටුව 2017 මූල්‍ය වර්ෂය තුළදී අවස්ථා  හයකදී රැස්වී ඇති අතර ඔවුන්ගේ පැමිණීම පහත දැක්වෙන පරිදි වේ:

| නම | 2017 | | | | | |
|---|---|---|---|---|---|---|
| | පෙබ. 02 | අප්‍රේල් 05 | ජූනි 21 | සැප්. 12 | දෙසැ. 23 | දෙසැ. 28 |
| පී.බී.එස්.සී. නෝනිස් මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| එස්.එම්.එන්.එල්. සේනානායක මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඉංජි. එච්.බී. ජයසේකර මහතා | ✓ | ✓ | - | - | ✓ | ✓ |

වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මෙන්ම බාහිර විගණන නිලධාරීන්ට සුදුසු අවස්ථාවලදී සාකච්ඡා සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලැබේ. විගණන කමිටුවේ කටයුතු නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

## අනුකූල වීම

අදාළ නීති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාකාරී වීමට කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහතික වන අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වන බව සහතික කරනු ලැබේ. පවතින පාලන ක්‍රම සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කමිටුව ඇගයීමක් සිදු කරන ලද අතර පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය අතිරේක පාලනයන් සහ අවදානම් වැළැක්වීමේ උපායමාර්ගයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**පී.බී.එස්.සී. නෝනිස්**

සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව

තවද කාරක සභාව විසින් කාර්යාංශයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය සමාලෝචනය කර එහි ව්‍යාපාර කටයුතු සඳහා අනාගත අපේක්ෂාවන් පිළිබඳව ඇගයීමක් සිදු කර, ඒ අනුව අදාළ ගිණුම් වාර්තා පිළියෙල කිරීම සඳහා භාවිත කරන ලද අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය යෝග්‍ය වන බව සහතික කර ඇත.

## බාහිර විගණනය

කාර්යාංශයේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කරනු ලැබේ.

# ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ඒකාබද්ධ තොරතුරු

### 1.1 පිහිටීම සහ නීතිමය තත්ත්වය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, වර්ෂ 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ විධිවිධාන යටතේ ස්ථාපිත ශ්‍රී ලංකාවේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටා ඇත.

2013 දෙසැම්බර් මස 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, කාර්යාංශය සහ එහි පරිපාලිත සමාගම්වලින් (එක්ව ගත්කල "සමූහය" ලෙස හැඳින්වෙන) සමන්විත වේ.

කාර්යාංශයේ සියළු සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, උපදේශන සහ ඕනෑම ඉංජිනේරුමය සම්බන්ධිත ක්‍රියාකාරකම් ව්‍යාපාරයන්හි නිරතව සිටී.

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (මඉසේස) සම්පූර්ණයෙන්ම ඉකාමඋකා ට අයත් අනුබද්ධිත සමාගමක් වන අතර ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත එම ආයතනය විසින් හෝ සමූහ ව්‍යාපාරයක හෝ සමූහයක සමාජිකයෙකු ලෙස සිවිල්, විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම්-සැලසුම්, ටර්න්කී සහ වෙනත් ආකාරයේ ඉදිකිරීම් කාර්යයන් මෙන්ම ඒ හා සම්බන්ධිත හෝ අනුබද්ධ හෝ ඊට අනුෂංගික ව්‍යාපාර භාරගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටී.

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සම කොටස්වල වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය මෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින්ද සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (**SLFRS** සහ **LKAS**) අනුව සකස් කර ඇත.

විශේෂයෙන් සඳහන් කර නොමැති නම් පරිපාලිත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන, කාර්යාංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස සකස් කර ඇත.

### 2.2 ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මතු දැක්වෙන භෞතික අයිතමයන් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- සාධාරණ වටිනාකමට අගයන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්. **(LKAS -39)**
- දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ සාධාරණ වටිනාකමට අගයනු ලැබේ. **(LKAS -16)**
- ආයුගණක තක්සේරු කිරීම් පදනම් කර ගනිමින් හඳුනාගත් සේවක ප්‍රතිලාභ බැරකම්. **LKAS-19)**

ප්‍රත්‍යාසන්න අනාගතයේදී අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට සමූහයට ඇති හැකියාව කාර්යාංශයේ අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමට ලක් කර ඇති අතර ව්‍යාපාරය ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් එහිදී පෙනී ගොස් නොමැත.

### 2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

කාර්යාංශයේ ක්‍රියාකාරි මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

### 2.4 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (**SLFRS**) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා, වත්කම් සහ බැරකම්, ආදායම් සහ වියදම් වල ප්‍රතිපත්ති සහ වාර්තාගත ප්‍රමාණයන් යොදාගැනීමට බලපෑම් ඇති කරන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන, අතීත අත්දැකීම් සහ අදාල තත්ත්වයන් යටතේ සාධාරණ යැයි හැ[illegible]න වෙනත් විවිධ සාධක මත පදනම් වන අතර එහි ප්‍රතිඵල විසින් වෙනත් ප්‍රභවයන්ගෙන් පහසුවෙන් ගම්‍යමාන නොවන වත්කම් සහ බැරකම් වල පවතින වටිනාකම් සම්බන්ධයෙන් තීන්දු ගැනීමේදී පදනම සකස් කරනු ලැබේ.

ඉදිරියට යෑමේ පදනම මත ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අගයනු ලැබේ. සංශෝධනය බලපානු ලබන්නේ එම මූල්‍ය වර්ෂය සඳහා හෝ සංශෝධනයේ කාලපරිච්ඡේදය සඳහා පමණක් නම් ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයේදීද වර්තමාන සහ අනාගත යන මූල්‍ය වර්ෂ දෙවර්ගය සඳහාම සංශෝධනය බලපානු ලබන්නේ නම් අනාගත කාලපරිච්ඡේදයේදීද ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනාගනු ලැබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබූ ප්‍රමාණයන් මත වඩාත් සැළකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මතු දැක්වෙන සටහන්වල ඇතුලත් කර ඇත:

| තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු/ තීන්දු | සටහන් අංකය | පිටු අංකය |
|---|---|---|
| කොන්ත්‍රාත් ආදායම, පිරිවැය සහ නිම කරන ලද ප්‍රතිශතය | 09 | 28 |

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබූ ප්‍රමාණයන් මත වඩාත් සැළකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මතු දැක්වෙන සටහන්වල ඇතුලත් කර ඇත:

| තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු/ තීන්දු | සටහන් අංකය | පිටු අංකය |
|---|---|---|
| දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 15 | 29/30 |
| සේවක ප්‍රතිලාභ | 22 | 32 |
| විලම්භිත බදු බැරකම් | 23 | 33 |

## 3 සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 ඒකාබද්ධ වීමේ පදනම

#### (a) ව්‍යාපාර ඒකාබද්ධ වීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 10-“ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන” වල විධිවිධාන ප්‍රකාරව සමූහයේ මූල්‍ය ප්‍රකාශන, සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ අනුබද්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ වීමෙන් සමන්විත වේ.

#### (b) අනුබද්ධිත ආයතන

අනුබද්ධිත ආයතන යනු සමූහය මඟින් පාලනය වන ආයතන වේ. පාලනය ආරම්භ කරන ලද දින සිට පාලනය අවසන් වන දින දක්වා අනුබද්ධිත ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන සමූහයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් වේ. සමූහය විසින් යොදාගන්නා ප්‍රතිපත්ති සමඟ ගැලපීම සඳහා අනුබද්ධිත ආයතනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍ය අවස්ථාවලදී වෙනස් කරනු ලැබේ.

#### (c) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙන

අන්තර්-සමූහ ශේෂයන් සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් පැන නගින කිසියම් උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉවත් කරනු ලැබේ. සමකොටස් ගිණුම්ගත ආයෝජිතයින් සමඟ ගනුදෙනු වලදී පැන නඟින උපලබ්ධි නොවූ ලාභ ආයෝජනයට එරෙහිව ආයෝජිතයාට සමූහයෙහි ඇති කැමැත්තේ ප්‍රමාණයට ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ උපලබ්ධි නොවූ ලාභ ඉවත් කරන ලද අකාරයට සමාන ආකාරයකින් ඉවත් කරනු ලබන නමුත් එසේ සිදු කරනු ලබන්නේ අගය අඩුවීම පිළිබඳ සාක්ෂියක් නොමැති ප්‍රමාණය දක්වා පමණි.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු

ගනුදෙනුව සිදුකරන අවස්ථාවේදී පවතින විනිමය අනුපාතය අනුව සියළු විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාකාරී මුදල් වර්ගයට පරිවර්තනය කරනු ලැබේ. වාර්තාකරණ දිනට පවත්නා ස්ථානීය විනිමය අනුපාතිකය අනුව විදේශ මුදල් වලින් නාමකරණය කරන ලද මූල්‍යමය වත්කම් සහ බැරකම් ක්‍රියාකාරී මුදල් වර්ගයට නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල් වර්ගයක පවතින ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මුදල්මය නොවන අයිතම මුල් ගනුදෙනු දිනට පවතින විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ. වටිනාකම් නිශ්චය කරනු ලබන අවස්ථාවේදී පැවති විනිමය අනුපාත භාවිතා කරමින් මුදල්මය නොවන වත්කම් සහ බැරකම් පරිවර්තනය කරනු ලැබේ. පරිවර්තන වෙනස ඇතිකරලීම සඳහා හේතු වූ අයිතමයේ ලාභයට හෝ අලාභයට සමගාමීව මුදල්මය නොවන අයිතම පරිවර්තනය කිරීමෙන් පැන නඟින ලාභය හෝ අලාභය හඳුනාගනු ලැබේ.

විදේශ මුදල් ගනුදෙනු පරිවර්තනය කිරීම මත පැන නඟින විදේශ මුදල් වෙනස්කම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනාගනු ලැබේ.

## 3.3 මූල්‍ය මෙවලම්

### (a) මූල්‍ය වත්කම්

සමූහය විසින් ආරම්භයේදී ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවායේ ආරම්භක දිනයට හඳුනාගනු ලැබේ. අනිකුත් සියළු මූල්‍ය වත්කම් සමූහය මෙවලමෙහි කොන්ත්‍රාත්තුගත ප්‍රතිපාදන සඳහා පාර්ශවයක් බවට පත්වන වාණිජ දිනට ආරම්භයේදී හඳුනාගනු ලැබේ.

වත්කමෙන් ලැබෙන මූල්‍ය ප්‍රවාහ සඳහා පවතින කොන්ත්‍රාත්තුගත අයිතීන් කල්ඉකුත් වූ විට හෝ මූල්‍යමය වත්කමෙහි අයිතියෙහි සියලුම අවදානම් සහ පරිදානයන් සැලකිය යුතු ප්‍රමාණයකින් පවරනු ලබන ගනුදෙනුවකදී මූල්‍යමය වත්කම පිළිබඳ කොන්ත්‍රාත්තුමය මූල්‍ය ප්‍රවාහයන් ලබාගැනීමේ අයිතීන් පවරන විටදී සමූහය විසින් මූල්‍යමය වත්කම හඳුනා නොගනී. සමූහය විසින් ඇති කරන ලද හෝ රඳවාගනු ලැබූ, පැවරූ  මූල්‍යමය වත්කම් වල කිසියම් පොළියක් වෙන් වූ වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ එකවිටම වත්කම් උපලබ්ධි කර බැරකම නිරවුල් කිරීමට හෝ අදහස් කරනු ලබන අගයන් හිලව් කිරීමට සමූහයට නීතිමය අයිතියක් පවතින විටදී සහ එවැනි විටකදී පමණක් මූල්‍යමය වත්කම් සහ බැරකම් හිලව් කරන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉදිරිපත් කරනු ලැබේ.

සමූහයට මතු සඳහන් ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම් පවතී:ණය සහ ලැබිය යුතු දෑ සහ විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම්.

#### *(i)* ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ ප්‍රකාශයට පත් නොකල ස්ථාවර හෝ නිශ්චය කලහැකි ගෙවීම් සහිත මූල්‍යමය වත්කම් වේ. එවැනි වත්කම් සාධාරණ අගය එකතු කිරීම කවර හෝ සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට ආරම්භයේදී හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමට තදනන්තරව කවර හෝ අගය අඩුවීමේ අලාභ අඩුකර ඵලදායී පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂිත පිරිවැයට අගයනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ, මුදල් සහ මුදල් හා සමාන දෑ, සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු දෑ ඇතුළුව ණයකර සහ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑවල ආයෝජන වලින් සමන්විත වේ.

#### *(ii)* මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑවලට මුදල් ශේෂයන් අඩංගු වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍යතාවය සඳහා ඉල්ලුම් කිරීමේදී නැවත ගෙවිය යුතු සහ සමූහයේ මුදල් කළමනාකරණයේ අවශ්‍ය කොටසක් තනන බැංකු අයිරා මුදල් සහ මුදල් හා සමාන දෑවල සංඝටකයක් ලෙස ඇතුලත් කරනු ලැබේ.

#### *(iii)* කල් පිරීම සඳහා තබා ඇති

ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොකළ මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම්, ඒවා කල්පිරීම සඳහා තබා ගැනීමට සමූහයට ධනාත්මක අරමුණක් සහ හැකියාවක් පවතින විට කල්පිරීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ඇගයීමෙන් පසු කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන ඵලදායී පොළී ක්‍රමවේදය භාවිතා කරමින්, අගය අඩු වීම අඩු කර ක්‍රමක්ෂිත පිරිවැයට අගයනු ලැබේ. අත්පත් කර ගැනීම මත කවර හෝ වට්ටමක් හෝ වාරිකයක් සහ ඊෂසෘ හි අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැළකිල්ලට ගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලැබේ.

ඊෂසෘ ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමෙහි ඇතුලත් කර ඇත.

#### *(iv)* විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම්

විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම්, විකිණීම සඳහා පවතින ලෙස නාමකරණයක කරන  ලද සහ වෙනත් කිසිම මූල්‍යමය වත්කමක් ලෙස වර්ගීකරණය නොකල ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම් වේ. සමකොටස් සුරැකුම්පත් වල සමූහය විසින් සිදු කර ඇති ආයෝජන විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මුල් හඳුනාගැනීමට තදනන්තරව, ඒවා සාධාරණ වටිනාකමට අගයනු ලැබේ, එහි වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගන්නා අතර සාධාරණ වටිනාකම් සංචිතයෙහි සමකොටස් තුල ඉදිරිපත් කරනු ලැබේ. ආයෝජනයක් හඳුනානොගත් විට, වෙනත් විස්තීර්ණ ආදායම් වල සමුච්චිත ලාභය හෝ අලාභය, ලාභයට හෝ අලාභයට මාරු කරනු ලැබේ. කෙසේවෙතත්, ක්‍රියාකාරී වෙළඳපොළක ප්‍රකාශිත වෙළඳපොළ මිලක් නොමැති වීම හේතුවෙන් සාධාරණ වටිනාකම විශ්වාසනීයව මැනිය නොහැකි සමකොටස් මෙවලම්වල ආයෝජන පිරිවැයට අගයනු ලැබේ.

### (b) ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය බැරකම්

සමූහය මෙවලමෙහි කොන්ත්‍රාත්තුමය විධිවිධානයන්ට කොටස්කරුවෙකු වන වෙළඳ දිනට වෙනත් මූල්‍යමය බැරකම් මුලින් හඳුනාගනු ලැබේ.

එහි කොන්ත්‍රාත්තුමය බැඳීම් බැහැර කළ විට, අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට සමූහය මූල්‍යමය බැරකමක් හඳුනාගනු නොලැබේ.

සමූහය ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය බැරකම් වෙනත් මූල්‍යමය බැරකම් කාණ්ඩයට වර්ගීකරණය කරනු ලැබේ. එවැනි මූල්‍යමය බැරකම් සාධාරණ අගය එකතු කිරීම ඕනෑම සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට ආරම්භයේදී හඳුනාගනු ලැබේ. මූලික හඳුනාගැනීමට සමගාමීව මෙම මූල්‍යමය බැරකම් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ.වෙනත් මූල්‍යමය බැරකම්, ණය සහ අතමාරු, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වලින් සමන්විත වේ.

## 3.4 අගය අඩු වීම

### 3.4.1 ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට ගෙන නොගිය මූල්‍යමය වත්කමක් එහි අගය අඩු වී ඇති බවට පරමාර්ථ සාක්ෂියක් පවතීද යන්න නිශ්චය කර ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනට අගය කරනු ලැබේ. වත්කමෙහි ආරම්භක හඳුනාගැනීමෙන් පසු අලාභ අවස්ථාවක් ඇති වූ බවට සහ එම අලාභ අවස්ථාවට එම වත්කමෙහි අනාගත මුදල් ප්‍රවාහ මත විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි සෘණ බලපෑමක් තිබූ බවට පරමාර්ථ සාක්ෂිය මඟින් පෙන්වා දෙන්නේ නම් මූල්‍ය වත්කමක අගය අඩු වී ඇත.

ණයගැතියෙකු විසින් ණය නොගෙවා පැහැර හැරීම, එසේ නොවේ නම්, සමූහය විසින් සළකා නොබලනු ලබන සමූහයට හිඟව පවතින යම් මුදලක් කොන්දේසි මත ප්‍රතිව්‍යුහගත කිරීම, ණයගැතියෙකු හෝ නිකුත් කරන්නෙකු බංකොළොත්භාවයට පත්වන බවට ඇඟවීම් හෝ සුරැකුමක් සඳහා ක්‍රියාකාරී වෙළඳපළක් නොමැති වීම මූල්‍ය වත්කම් අගය අඩු වී ඇති බවට වන පරමාර්ථ සාක්ෂි වලට ඇතුලත් කළ හැකි වේ. ඊට අමතරව, සමකොටස් ඇපකරයක ආයෝජනයක් සඳහා එහි සාධාරණ අගය එහි පිරිවැයට අඩු සැළකිය යුතු හෝ කල් පවතින පහළ යෑම අගය අඩු වීමේ පරමාර්ථ සාක්ෂියක් වේ.

### 3.4.2 මූල්‍යමය වත්කම්

ලැබිය යුතු දෑ සඳහා අගය අඩු වීම පිළිබඳ සාක්ෂි සමූහය විසින් විශේෂිත වත්කම් මට්ටමකින් සළකා බලනු ලැබේ.විශේෂිත අගය අඩුවීම සඳහා සියළු තනි තනි වශයෙන් සැළකිය යුතු ලැබිය යුතු දෑ අගය කරනු ලැබේ.

වත්කමෙහි මුල් එලදායි පොළී අනුපාතයට වට්ටම්කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම සහ එහි පවතින වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කමක් හා සම්බන්ධ අගය අඩුවීමේ අලාභයක් මනිනු ලැබේ.අලාභ, ලාභ හෝ අලාභවල හඳුනාගන්නා අතර ලැබි යුතු දෑවලට එරෙහිව දීමනා ගිණුමෙහි පිළිබිඹු කරනුලැබේ. අගය අඩු වූ වත්කම මත පොළිය අවසන් නොකළ වට්ටම තුළින් අඛණ්ඩව හඳුනාගනු ලැබේ. සමගාමී සිද්ධියක් හේතුවෙන් අගය අඩුවීමේ අලාභය අඩු වූ විට, අගය අඩුවීමේ අලාභයෙහි සිදු වූ අඩු වීම ලාභ හෝ අලාභය හරහා වෙන් කරනු ලැබේ. විකිණීම සදහා පවතින ආයෝජන ඇපකරමත අගය අඩුවීමේ අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් හඳුනාගන්නා ලද සහ සමකොටස්වල සාධාරණ වටිනාකම් වෙන් කිරීම්වල ඉදිරිපත් කර ඇති සමුච්චිත අලාභ, ලාභ හෝ අලාභයට මාරු කිරීමෙන් හඳුනාගනු ලැබේ. වෙනත් විස්තීර්ණ ආදායම්වලින් ඉවත් කරන ලද සහ ලාභ හෝ අලාභයෙහි හඳුනාගන්නා ලද සමුච්චිත අලාභය, ඕනෑම ප්‍රධාන නැවත ගෙවීමක් සහ ක්‍රමක්ෂය හැර අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ලාභ හෝ අලාභයෙහි පෙර හඳුනාගන්නා ලද ඕනෑම අගය අඩුවීමේ අලාභයක් අඩුකිරීම වර්තමාන සාධාරණ අගය අතර වෙනසයි. කාලික වටිනාකමට ආරෝපණය කළහැකි අගය අඩුවීමේ වෙන්කිරීම්වල වෙනස්වීම් පොළී ආදායම්වල සංඝටකයක් ලෙස පිළිබිඹු කරනු ලැබේ.

### 3.4.3 මූල්‍යමය නොවන වත්කම්

බඩු වට්ටෝරු සහ විලම්භිත බදු වත්කම් හැර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම්, අගය අඩුවීමක් පිළබඳ කිසියම් ඇඟවීමක් පවතීද යන්න නිශ්චය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනට අගයනු ලැබේ. එවැනි යම් ඇඟවීමක් පවතී නම් එවිට වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ.

වත්කමක හෝ මුදල් උත්පාදනය කරනු ලබන ඒකකයක අයකරගත හැකි වටිනාකම භාවිතා කිරීමේ වටිනාකම සහ එහි සාධාරණ අගය අඩුකල විකිණීම සඳහා වන පිරිවැය යන මෙයින් වැඩි අගය වේ. භාවිතයේ පවතින වටිනාකම අගය කිරීමේදී, මුදලෙහි කාලික අගයෙහි වර්තමාන වෙළඳපොළ ඇගයීම් පිළිබිඹු කරන බදු-පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට විශේෂිත අවදානම භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ. අගය අඩු වීම පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සඳහා, වත්කම් වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවල මුදල් ගලනයෙන් විශාල වශයෙන් ස්වාධීන වන අඛණ්ඩ භාවිතයෙන් මුදල් උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට එක්ව කාණ්ඩගත කරනු ලැබේ (“මුදල් උත්පාදන ඒකකය”). අගය අඩු වීම පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සඳහා ව්‍යාපාර සංයෝජනයක් විසින් අත්පත්කර ගන්නා ලද කීර්තිනාමය සංයෝජනයෙහි සහක්‍රියාවලින් ප්‍රතිලාභ ලබනු ඇති බවට අපේක්ෂා කරන මුදල් උත්පාදන ඒකක වලට පවරනු ලැබේ.

වත්කමක පවතින වටිනාකම හෝ එහි මුදල් උත්පාදන ඒකකය එහි ඇස්තමේන්තු අයකරගතහැකි වටිනාකම ඉක්මවා යන්නේ නම් අගය අඩු වීමේ අලාභයක් හඳුනාගනු ලැබේ. අගය අඩු වීමේ අලාභ, ලාභ හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ. මුදල් උත්පාදන ඒකක වලට අදාලව හඳුනාගනු ලබන අගය අඩුවීමේ අලාභ ඒකකවලට පවරා ඇති යම් කීර්තිනාමයක පවතින වටිනාකම අඩු කිරීම සඳහා පළමුව වෙන් කරනු ලබන අතර ඉන් පසුව ප්‍රමාණුකූල පදනමින් ඒකකයෙහි (ඒකක කාණ්ඩයෙහි) වෙනත් වත්කම්වල පවතින වටිනාකම අඩු කිරීම සඳහා වෙන් කරනු ලැබේ.

කීර්තිනාමයට අදාල අගය අඩුවීමක් ප්‍රතිවර්ත නොවේ. අනෙකුත් වත්කම්වලට අදාලව, පෙර කාලපරිච්ඡේදවලදී හඳුනාගත් අගය අඩුවීමේ අලාභයෙහි කිසියම් අඩුවීමක් හෝ තවදුරටත් නොපවතින බවට වන කිසියම් ඇඟවීමක් සඳහා එක් එක් වාර්තාකරණ දිනට අගයනු ලැබේ. අයකරගතහැකි වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතාකළ ඇස්තමේන්තු වල වෙනසක් සිදු වී ඇත්නම් අගය අඩුවීමේ අලාභය ප්‍රතිවර්ත වේ. අගය අඩුවීමේ අලාභයක් හඳුනාගෙන නොමැති නම්, වත්කමෙහි පවතින වටිනාකම, ක්ෂයවීමෙන් හෝ ක්‍රමක්ෂයෙන් ශුද්ධව නිශ්චය කරනු ලැබිය හැකි පවතින වටිනාකම ඉක්මවා නොයන ප්‍රමාණයට පමණක් අගය අඩුවීමේ අලාභයක් ප්‍රතිවර්ත වේ.

## 3.5 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

### 3.5.1 හඳුනාගැනීම සහ මැනීම

වත්කම හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට ඉඩකඩ ඇතැයි සළකන්නේ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි වන්නේ නම්, දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ, හඳුනාගනු ලැබේ.

පිරිවැය/ප්‍රත්‍යාගණනය අඩුකිරීම සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත අගය අඩුවීමේ අලාභයන්ට වාර්තා කරනු ලැබේ.

### 3.5.2 කල්බදු වත්කම්

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අයිතමයක පිරිවැය එහි ගත් මිල සහ වත්කමෙන් අදහස් කරන භාවිතය ලබා ගැනීම සඳහා එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අරෝපණය කල හැකි ඕනෑම සෘජු පිරිවැයවලින් සමන්විත වේ. අමුද්‍රව්‍යයවල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කමෙන් අදහස් කරන භාවිතය ලබා ගැනීම සඳහා එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අරෝපණය කල හැකි වෙනත් ඕනෑම පිරිවැය, ස්වයංව තැනුනු වත්කම්වල පිරිවැයට ඇතුලත් වේ.

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක කොටස්වලට වෙනස් ප්‍රයෝජ්‍ය ජීව කාල ඇති විටදී, ඒවා දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි වෙන්වූ අයිතමයන් (ප්‍රධාන සංඝටක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

### 3.5.3 සින්නක්කර වත්කම්

හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් සමූහයට පැවරෙන කල්බදු, මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමේදී කල්බදු වත්කම එහි සාධාරණ වටිනාකමට වඩා අඩු සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට සමාන වටිනාකමකට අගය කර ප්‍රාග්ධනිත කරනු ලැබේ. මූලික හඳුනාගැනීමට තදනන්තරව, වත්කම එම වත්කමට අදාළ කර ගත හැකි ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ගිණුම්ගත කරනු ලැබේ.

### 3.5.4 තදනන්තර පිරිවැය

කොටස හා බැඳී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබිය හැකි වන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි වන්නේ නම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක කොටසක් මාරුකිරීමේ පිරිවැය අයිතමයෙහි පවතින වටිනාකමෙහි හඳුනාගනු ලැබේ. මාරු කළ කොටසෙහි පවතින වටිනාකම හඳුනා නොගනී. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි එදිනෙදා සේවා වියදම් දරනු ලැබූවක් ලෙස ලාභ අලාභයෙහි හඳුනාගනු ලැබේ.

වත්කම්වල ඉතිරිවන වටිනාකම හා වත්කමේ ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂය අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර, පූර්ව ඇස්තමේන්තු අනුව අපේක්ෂාවන් වෙනස් වේ නම්, **LKAS** 08 අනුව ගිණුම්කරණ තක්සේරුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තෙමින්තු සහ දෝෂයන් වෙනස් විය යුතුය.

### 3.5.5 හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ එහි භාවිතයෙන් හෝ අපහරණයෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. හඳුනා නොගැනීමේ ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ

### 3.5.6 ක්‍රමක්ෂය

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාල ඔස්සේ සරල රේඛීය ක්‍රමය මඟින් ලාභ හෝ අලාභයෙහි ක්‍රමක්ෂය හඳුනාගනු ලැබේ. කල්බදු කාලසීමාව අවසානයේදී සමූහයට හිමිකාරීත්වය ලැබෙන බවට හේතුසාධක සහිතව යම් නිශ්චිත භාවයක් පවතින විටදී හැර කල්බදු වත්කම් කල්බදු කාලසීමාව කෙටි වීම සහ ඒවායේ ප්‍රයෝජ්‍ය කාල ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාවිතය සඳහා යොදාගත හැකිව පවතින විටදී වත්කමක ක්‍රමක්ෂය ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති (හෝ විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද අපහරණ කාණ්ඩයකට ඇතුලත් කර ඇති විට) ලෙස වර්ගීකරණය කල දිනය සහ වත්කම හඳුනානොගන්නා දිනය යන දින දෙකෙන් මුල් දිනයට වත්කමක ක්‍රමක්ෂය අවසන් වේ. සින්නක්කර ඉඩම් සහ සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් මත ක්‍රමක්ෂය අය නොවේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය පහත පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | ප්‍රයෝජ්‍ය ජීව කාලය |
|---|---|
| **සින්නක්කර ගොඩනැගිලි** | වර්ෂ13-14 |
| **කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ සහ සවිකිරීම්** | වර්ෂ 5-8 |
| **ඉදිකිරීම් මෙවලම් සහ උපකරණ** | වර්ෂ 4-5 |
| **මෝටර් වාහන** | වර්ෂ 4 |
| **පිරියත සහ යන්ත්‍රසූත්‍ර** | වර්ෂ 5 |
| **කන්ටේනර** | වර්ෂ 5 |

### 3.5.7 සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

වාර්තාකරණ දිනට සම්පූර්ණ නොකල වර්ෂය තුළදී දරන ලද ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද සහ භාවිතයට ගත හැකිව පවතින ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවලට මාරු කර ඇත.

## 3.6 බඩු වට්ටෝරු

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමට අඩුවෙන් බඩු වට්ටෝරු තක්සේරු කරනු ලැබේ. පිරිවැය, බරතැබූ මධ්‍යයන පිරිවැය පදනමින් නිශ්චය කරනු ලබන අතර එයට බඩු වට්ටෝරු අත්පත් කර ගැනීමට සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම් ඇතුලත් වේ.

### 3.6.1 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

එදින දක්වා සිදු කරන ලද කොන්ත්‍රාත් කාර්යයන් සඳහා සේවාදායකයින්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත බිල් නොකල දළ වටිනාකම සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් කොන්ත්‍රාත් වලින් නියෝජනය වේ. විශේෂිත ව්‍යාපෘති සඳහා සෘජුව සම්බන්ධ වන සියළු වියදම් සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් කරගනිමින් සමූහයේ කොන්ත්‍රාත් කාර්යයන්හි දරන ලද ස්ථාවර සහ විචල්‍ය පොදු කාර්ය පිරිවැය වෙන් කිරීමක් පිරිවැයට ඇතුලත් වේ. දරන ලද පිරිවැය සහ හඳුනාගත් ලාභ එකතු කල විට ප්‍රගති බිල්පත් ඉක්මවන සියළු කොන්ත්‍රාත් සදහා කෙරෙමින් පවතින ඉදිකිරීම් කොන්ත්‍රාත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ අනෙකුත් ලැබීම්වල කොටසක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ හඳුනාගත් ලාභ එකතු කල විට ලැබෙන අගය ප්‍රගති බිල්පත් ඉක්මවා යන විට, වෙනස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑවල කොටසක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

## 3.7 සේවක ප්‍රතිලාභ

### (a) අර්ථ දැක්වූ දායකත්ව සැලසුම්

අර්ථදැක්වූ දායකත්ව සැලසුම පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එහිදී දායකත්වය වෙනම අරමුදලකට යවනු ලබන අතර වැඩිදුර මුදල් ගෙවීම සඳහා ආයතනයට නීතිමය හෝ අර්ථකාරී බැඳීමක් නොමැත. සේවකයා විසින් සේවය සපයනු ලබන කාලපරිච්ඡේදයේදී අර්ථ දැක්වූ දායකත්ව සැලසුමට දායකත්වය දැක්වීම සඳහා වන බැඳීම් සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ අලාභයෙහිහඳුනාගනු ලැබේ. අනාගත ගෙවීම්වල මුදල් නැවත ගෙවීමක් හෝ අඩුකිරීමක් පවතින ප්‍රමාණයට පෙරගෙවුම් දායකත්වයන් වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.

#### අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්ති භාරකාර අරමුදලේ දායකත්වය සඳහා සුදුසුකම් සහිත සියලුම සේවකයින් අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව අදාල දායකත්ව අරමුදල් මඟින් ආවරණය වේ. සමූහය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්ති භාරකාර අරමුදලට සේවකයාගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% ක දායකත්වයක් දක්වනු ලැබේ.

### (b) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් බැරකම වාර්තාකරණ දිනට අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකමවේ. සේවක ප්‍රතිලාභ- **LKAS** 19 මඟින් නිර්දේශ කර ඇති ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (**PUC**) භාවිතා කරමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම ස්වාධීන ආයුගණකවරුන් විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදු වූ කාලපරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායම්වල සම්පූර්ණයෙන් හඳුනාගනු ලැබේ.

අවම වශයෙන් වර්ෂ තුනකට වරක් ආයුගණක තක්සේරු කිරීම් සිදු කිරීමට සමූහය අපේක්ෂා කරයි.

අර්ථ දැක්වූ බැඳීමේ වර්තමාන වටිනාකම ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකල්පන සළකා බලමින් පාරිතෝෂික බැරකම ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (ඡඹක) භාවිතා කරමින් අගය කරනු ලැබේ.

කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත ප්‍රකාරව වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකු සඳහා පාරිතෝෂික බැරකම පැන නගී.

## 3.8 වෙන්කිරීම්

පසුගිය ක්‍රියාවක ප්‍රතිඵලයක් හේතුවෙන් විශ්වාසනීයව ඇස්තමේන්තු කල හැකි වර්තමාන නීතිමය හෝ අර්ථකාරී බැඳීමක් සමූහයට පවතින්නේ නම් සහ එම බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගැලීමක් අවශ්‍ය වනු ඇති බව පෙනී යන්නේ නම් වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම් සහ බැරකම් ශේෂ පත්‍රයෙහි හඳුනාගනු ලැබේ. මුදලෙහි කාලික අගයෙහි වර්තමාන වෙළඳපොළ ඇගයීම පිළිබිඹු කරන බදු-පෙර වට්ටම් අනුපාතයකට සහ බැරකමට විශේෂිත අවදානම භාවිතා කරමින් අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමෙන් වෙන්කිරීම් නිශ්චය කරනු ලැබේ . අවසන් කළ නොහැකි වට්ටම් කිරීම මූල්‍යමය පිරිවැයක් ලෙස හඳුනාගනු ලැබේ.

## 3.9 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

### 3.9.1 ආදායම

### (a) ඉදිකිරීම් කොන්ත්‍රාත්

#### කොන්ත්‍රාත් ආදායම මැනීම සඳහා සම්මත තාක්ෂණික කමිටු (STC) අනුමැතිය අවශ්‍ය කොන්ත්‍රාත්

STC අනුමැතිය ලබා දීමට නියමිත ව්‍යාපෘති, කොන්ත්‍රාත්තුවේදී එකඟ වූ ආරම්භක ආදායම් ප්‍රමාණයෙන් 90% එකතු කිරීම ඒවා ආදායම් උත්පාදනය කරනු ඇති සහ විශ්වසනීයව මැනීය හැකි ප්‍රමාණයට කොන්ත්‍රාත් කාර්යයේ වෙනස්වීම්, හිමිකම් සහ පාරිතෝෂික ගෙවීම් ලෙස කොන්ත්‍රාත් ආදායම හඳුනාගනු ලැබේ.

වෙනත් කොන්ත්‍රාත්

කොන්ත්‍රාත්තුව සඳහා ආරම්භයේදී එකඟ වූ මුදල එකතු කිරීම ඒවා ආදායමක් ලබා දෙනු ඇති බවට සහ විශ්වසනීයව මැනිය හැකි වන බව පෙනී යන ප්‍රමාණයට කොන්ත්‍රාත් කාර්යය, හිමිකම්පෑම් සහ ප්‍රසාද දීමනා ගෙවීම්වල යම් වෙනස්කමක් කොන්ත්‍රාත් ආදායමට ඇතුලත් වේ.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලය විශ්වාසනීයට ඇස්තමේන්තු කල හැකි වන විහාම, කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර ඇති අදියරට සමානුපාතිකව කොන්ත්‍රාත් ආදායම ලාභ හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ.

එදිනට සිදු කර ඇති කාර්ය සඳහා දරා ඇති කොන්ත්‍රාත් පිරිවැය, ඇස්තමේන්තුගත මුළු කොන්ත්‍රාත් පිරිවැයට දරන අනුපාතයට අනුව සම්පූර්ණ කර ඇති අදියර අගයනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලය විශ්වසනීයව ඇස්තමේන්තු කල නොහැකි වූ විට, දරන ලද කොන්ත්‍රාත් පිරිවැය නැවත අයකර ගත හැකි ප්‍රමාණය දක්වා පමණක් කොන්ත්‍රාත් ආදායම හඳුනාගනු ලැබේ.

### (b) උපදේශන සේවාවන්

ඉංජිනේරු ව්‍යාපෘති ආශ්‍රිත උපදේශන සේවා සැපයීමෙන් සමූහය ආදායම් උත්පාදනය කරනු ලැබේ. පහත සඳහන් ආකාරයට උපදේශන කොන්ත්‍රාත්වල ස්වභාවය, විෂය පථය, වටිනාකම සහ කාලසීමාව අනුව උපදේශන සේවාවල ආදායම හඳුනාගනු ලැබේ.

**1.** සම්පූර්ණ කර ඇති අදියර ක්‍රමය

උපදේශන සේවාවලින් ලැබෙන ආදායම, වාර්තාකරණ දිනට ගනුදෙනුවෙහි අදියරට සාපේක්ෂව හඳගනු ලැබේ. සිදු කරන ලද කාර්යයන් සමාලෝචනය කිරීමෙන් සම්පූර්ණ කර ඇති අදියර අගයනු ලැබේ.

**2.** ලදුපත් ක්‍රමය

කොන්ත්‍රාත්තුවක සම්පූර්ණ කර ඇති අදියර විශ්වසනීයව මැනිය නොහැකි උපදේශන සේවාවල ආදායම ලදුපත් ක්‍රමයෙන් හඳුනාගනු ලැබේ.

**3.** එකතු කිරීමේ ක්‍රමය

"නඩත්තු ඉල්ලීම්" ව්‍යපෘතිවලින් ලැබෙන ආදායම මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය අනුව හඳුනාගනු ලැබේ.

### 3.9.2 පොළී ආදායම

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන සියලු මූල්‍ය මෙවලම් සහ විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කල පොළියක් දරන මූල්‍යමය වත්කම් සඳහා ඵලදායී පොළී ක්‍රමවේදය (**EIR**) එනම් මූල්‍ය මෙවලමෙහි අපේක්ෂිත ආයු කාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් ඔස්සේ හෝ යෝග්‍ය අවස්ථාවලදී මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ පවතින වටිනාකමට අනාගත මුදල් ලැබීම් හෝ ගෙවීම් සත්‍ය වශයෙන්ම වට්ටම්ගත කරනු ලබන පොළී අනුපාතය භාවිතා කරමින් පොළී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ. පොළී ආදායම, විස්තීර්ණ ආදායම් ආදායම් ප්‍රකාශනයෙහි මූල්‍ය ආදායමට ඇතුලත් කරනු ලැබේ.

### 3.9.3 ලාභාංශ ආදායම

ගෙවීමක් ලැබීමට ඇති කොටස් හිමියන්ගේ අයිතිය තහවුරු කල විට ලාභාංශ ආදායම් ගිණුම්ගත කරනු ලැබේ.

### 3.9.4 වෙනත් ආදායම්

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේ ලාභ හෝ අලාභ, බැහැර කිරීමෙන් ලබන මුදල්, වත්කම්වල පවතින වටිනාකම සහ සම්බන්ධිත වියදම් අඩුකිරීමෙන් පසුව හඳුනාගනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ අලාභ ශුද්ධ පදනමින් වාර්තාකරනු ලැබේ.

### 3.9.5 වියදම හඳුනාගැනීම

### (a) ඉදිකිරීම් සහ උපදේශන පිරිවැය

අනාගත කොන්ත්‍රාත් ක්‍රියාකාරිත්වයකට සම්බන්ධ වත්කමක් උත්පාදනය කිරීමේදී හැර කොන්ත්‍රාත් වියදම් දැරීමක් ලෙස හඳුනාගනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා වන මුළු පිරිවැය එහි ආදායමට ඉක්මවා ඇති බවට අදහස් කරන විටදී අපේක්ෂිත අලාභ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### (b) වෙනත් වියදම්

වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය කරගෙන යෑමේ සහ දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ කාර්යක්ෂම අයුරින් නඩත්තු කිරීමෙහි දරන ලද සියලු වියදම් ආදායමට එක් කර ඇත.

### 3.9.6 බදුකරණය

### (a) වර්තමාන බදු

වර්තමාන සහ පෙර කාලපරිච්ඡේද සඳහා වන වර්තමාන ආදායම් බදු බැරකම් අයකරගත හැකි වන බවට අපේක්ෂිත හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවන ලද ප්‍රමාණයට අගයනු ලැබේ. එම ප්‍රමාණය ගණනය කිරීමේදී යොදා ගන්නා ලද බදු අනුපාත සහ බදු නීති පනවා ඇති හෝ වාර්තාකරණ දිනට නිත්‍ය වශයෙන් පනවා ඇති ඒවා වේ.

ආදායම් බදු සඳහා වෙන් කිරීම්, මූල්‍ය ප්‍රකාශන වල වාර්තාකර ඇති ආදායම් සහ වියදම් වල මූලාවයව මත පදනම්ව සහ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ගණනය කර ඇත.

සබැඳි විස්තර අදාල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වල අනාවරණය කර ඇත.

### (b) විලම්භිත බදු

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය සඳහා වත්කම් සහ බැරකම්වල පවතින වටිනාකම් සහ බදුකරණ අවශ්‍යතා සඳහා යොදාගන්නා ලද වටිනාකම් අතර තාවකාලික වෙනස්කම්වලට අදාලව විලම්භිත බදු හඳුනාගනු ලැබේ. පහත සඳහන් දෑ සඳහා විලම්භිත බදු හඳුනා නොගනී:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුමකරණ හෝ බදු අයකල හැකි ලාභයට හෝ අලාභයට බලපෑම් ඇති නොකරන ගනුදෙනුවකදී වත්කම් හෝ බැරකම්වල ආරම්භක හඳුනාගැනීම මත තාවකාලික වෙනස්කම්;
- නුදුරු අනාගතයේදී ප්‍රතිවර්ත නොවනු ඇති බවට අදහස් කරනු ලබන ප්‍රමාණයට අනුබද්ධිත ආයතන සහ හවුල්ව පාලනය කරන ආයතනවල ආයෝජනයන් හා සබැඳි තාවකාලික වෙනස්කම්; සහ
- කීර්තිනාමය ආරම්භයේදී හඳුනාගැනීම මත පැන නගින බදු අයකල හැකි තාවකාලික වෙනස්කම්.

වාර්තාකරණ දිනට පනවා ඇති හෝ නිත්‍ය වශයෙන් පනවා ඇති නීති පදනම් කර ගනිමින් ඒවා ප්‍රතිවර්ත වනවිට තාවකාලික වෙනස්කම්වලට යොදාගත හැකි යැයි අපේක්ෂිත බදු අනුපාතයට විලම්භිත බදු අගයනු ලැබේ.

## 4 සාමාන්‍ය ව්‍යාපාර කොටස්

සාමාන්‍ය ව්‍යාපාර කොටස් සමකොටස් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාන්‍ය ව්‍යාපාර කොටස් නිකුත් කිරීමට සෘජුව ආරෝපණය කළ හැකි වර්ධනය වන පිරිවැය, කවර හෝ බදු අයකිරීමක් හැර සමකොටස්වලින් අඩු කිරීමක් ලෙස හඳුනාගනු ලැබේ.

## 5 අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර ප්‍රත්‍යාසන්න අනාගතය සඳහා ව්‍යාපාර සිදු කරගෙන යෑමට සම්පත් ප්‍රමාණවත්ව පවතින බවට සෑහීමට පත් වී ඇත. තවද, අඛණ්ඩව පැවතීම සඳහා සමූහයේ/සමාගමේ හැකියාව සම්බන්ධයෙන් සැකයක් ඇති කළ හැකි තරමේ සැලකිය යුතු අවිනිශ්චිතා පිළිබඳ කළමනාකාරිත්වය දැනුවත් වී නොමැත. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමින් සකස් කිරීම සිදු කරගෙන යනු ලැබේ.

## 6 සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු

මුදලක් අය කරනු ලබන්නේද යන්න නොසළකමින්, එක් පාර්ශවයකට පාලනය කිරීමේ හැකියාව පවතින හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අනෙක් පාර්ශවයේ මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති/තීරණ පිළිබඳ ගනුදෙනු සම්බන්ධයෙන් අනාවරණය කිරීම් සිදු කර ඇත. අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 27හි අනාවරණය කර ඇත.

## 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත **LKAS** 7 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන, අනුව වක්‍ර ක්‍රමවේදය භාවිතා කිරීමෙන් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

## 8 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදු වන සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම් වේ.

වාර්තාකරණ දින පසුව සිදුවන සිදුවීම් වල වැදගත්භාවය සළකා බලනු ලබන අතර සුදුසු ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය තැන්වලදී මූල්‍ය ප්‍රකාශනවල සිදු කරනු ලැබේ.

## 9 වාර්තාකරණ දිනට බලාත්මක නොවන නමුත් නිකුත් කර ඇති නව ගිණුම්කරණ ප්‍රමිතු

සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන ලද දිනට බලාත්මක නොවන නමුත් නිකුත් කර ඇති ප්‍රමිතීන් සහ අර්ථ දැක්වීම් පහත විස්තර කර ඇත. යොදා ගත යුතු නම්, ඒවා බලාත්මක වූ විට මෙම ප්‍රමිතයන් අදාළ කර ගැනීමට සමූහය අදහස් කරයි.

### (a) SLFRS 09 - මූල්‍යමය උපකරණ

**LKAS**-39- "මූල්‍ය මෙවලම්: හඳුනාගැනීම සහ මැනීම" හි ප්‍රතිස්ථාපනය වීම **SLFRS** 9 නිකුත් කිරීම මඟින් පිළිබිඹු කරන අතර **LKAS** 39 හි අර්ථ දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ගීකරණය හා මැනීම සඳහා අදාළ වේ. 2018.01.01 දිනට හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදය සඳහා මෙම ප්‍රමිතය බලාත්මක වේ. **SLFRS** 9 අදාල කර ගැනීම සමාගමේ සහ සමූහයේ මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම මත බලපෑමක් ඇති කරනු ඇත.

### (b) LFRS 15 - සේවාදායකයන් සමඟ කොන්ත්‍රාත්වලින් ආදායම් ලැබීම්

කොපමණ ප්‍රමාණයක්ද සහ කවර වේලාවටද යන්න නිශ්චය කිරීම සඳහා **SLFRS** - 15 මගින් විස්තීර්ණ රාමුවක් ස්ථාපිත කෙරේ. එමගින් පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශ **LKAS** 18 "ආදායම", **LKAS** 11 "ඉදිකිරීම් කොන්ත්‍රාත්" ප්‍රතිස්ථාපනය කෙරේ. කලින් යොදා ගැනීමේ අවසරය සමඟ 2018.01.01 දිනට හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදය සඳහා **SLFRS** 15 බලාත්මක වේ.

මෙම ප්‍රමිතීන් බලාත්මක වනවිට සමූහය ඒවා යොදා ගනු ඇත. සවිස්තරාත්මක සමාලෝචනයක් දක්වන තුරු, මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කළ දිනට මූල්‍යමය බලපෑම සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැකිය.

## ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදෙශක කාර්යාංශය

### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | සමූහය 2017 රු. | සමූහය 2016 රු. | ඉකාපිමඋකා 2017 රු. | ඉකාපිමඋකා 2016 රු. |
|---|---|---|---|---|---|
| **ආදායම** | 9 | **15,209,624,006** | 11,674,570,503 | **13,195,637,498** | 10,333,280,821 |
| විකුණුම් පිරිවැය | 10 | (13,312,355,493) | (9,853,816,338) | (12,075,714,656) | (9,179,818,923) |
| **දළ ලාභය** | | **1,897,268,513** | 1,820,754,165 | **1,119,922,842** | 1,153,461,898 |
| **වෙනත් ආදායම්** | 11 | 134,210,273 | 218,971,425 | 179,759,198 | 272,930,388 |
| පරිපාලන වියදම් | | (1,395,814,503) | (1,151,207,809) | (718,018,736) | (601,403,438) |
| විකුණුම් සහ බෙදාහැරීම් පිරිවැය | | (140,237,585) | (222,937,513) | (131,766,570) | (213,573,602) |
| | | **495,426,698** | 665,580,269 | **449,896,734** | 611,415,245 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම්** | | | | | |
| මූල්‍ය ආදායම | | 445,958,333 | 282,598,968 | 316,507,931 | 210,668,182 |
| මූල්‍ය වියදම | | (26,342,723) | (22,135,246) | (9,753,126) | (6,263,475) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | 12 | **419,615,611** | 260,463,722 | **306,754,804** | 204,404,707 |
| **බදු පෙර ලාභය** | 13 | **915,042,308** | 926,043,990 | **756,651,538** | 815,819,952 |
| ආදායම් බදු වියදම් | 14 | (392,859,134) | (401,823,227) | (355,346,282) | (376,156,549) |
| **වර්ෂය සඳහා ලාභ/(අලාභ)** | | **522,183,174** | 524,220,763 | **401,305,256** | 439,663,403 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ ආයුගණක ලාභය | 22 | (6,529,540) | 20,297,204 | (5,919,064) | 20,282,110 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **515,653,634** | 544,517,967 | **395,386,192** | 459,945,513 |

පිටු අංක 28 සිට 36 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | සමූහය | | සංස්ථාව | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා** | | **2017** රු. | **2016** රු. | **2017** රු. | **2016** රු. |
| **වත්කම්** | Note | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 15 | **2,852,702,138** | 2,905,911,035 | **2,372,710,383** | 2,509,023,699 |
| ආයෝජන | 16 | **51,117,849** | 38,489,824 | **61,117,869** | 46,957,402 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,903,819,987** | 2,944,400,859 | **2,433,828,252** | **2,555,981,101** |
| **ජංගම වත්කම්** | | | | | |
| ඉන්වෙන්ටරි | 17 | **832,849,205** | 785,057,154 | **10,638,501** | 16,857,933 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 18 | **14,779,002,414** | 11,485,838,621 | **14,400,921,345** | 11,013,443,138 |
| කෙටි කාලීන ආයෝජන | 16 | **4,094,534,947** | 4,081,356,846 | **2,983,463,922** | 3,035,639,354 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 20 | **691,640,433** | 648,439,480 | **461,781,166** | 440,730,586 |
| සම්බන්ධිත පාර්ශව සමාගම්වලින් හිඟ | 19 | | | **1,565,621,738** | 1,371,069,905 |
| **මුළු ජංගම වත්කම්** | | **20,398,026,998** | 17,000,692,101 | **19,422,426,671** | **15,877,740,916** |
| **මුළු වත්කම්** | | **23,301,846,985** | 19,945,092,960 | **21,856,254,923** | **18,433,722,017** |
| **සමකොටස් සහ බැරකම්** | | | | | |
| දායක ප්‍රාග්ධනය | | **500,000** | 500,000 | **500,000** | 500,000 |
| ප්‍රාග්ධන සංචිත | 26 | **3,028,000** | 3,028,000 | **3,028,000** | 3,028,000 |
| රඳවාගත් ඉපැයීම | | **6,012,648,538** | 5,496,994,903 | **5,599,699,524** | 5,204,313,332 |
| මුළු සමකොටස් | | **6,016,176,538** | 5,500,522,903 | **5,603,227,524** | **5,207,841,332** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| කල්බදු ණය හිමියන් | 21 | **-** | - | **-** | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 22 | **165,820,347** | 158,063,895 | **161,242,343** | 156,587,664 |
| විලම්භිත බදු | 23 | **22,581,183** | 21,820,955 | **-** | - |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **188,401,530** | **179,884,851** | **161,242,343** | **156,587,664** |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 24 | **16,124,875,069** | 13,293,081,842 | **15,156,893,565** | 12,120,903,654 |
| ගෙවිය යුතු ආදායම් බදු | 25 | **972,393,849** | 971,603,364 | **934,891,491** | 948,389,368 |
| **මුළු ජංගම බැරකම්** | | **17,097,268,918** | 14,264,685,206 | **16,091,785,056** | **13,069,293,022** |
| **මුළු බැරකම්** | | **17,285,670,447** | 14,444,570,057 | **16,253,027,399** | **13,225,880,686** |
| **මුළු සමකොටස් සහ බැරකම්** | | **23,301,846,985** | 19,945,092,960 | **21,856,254,923** | **18,433,722,017** |

පිටු අංක 28 සිට 36 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

යූ.එන්.බී. මාවතගම
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහ සඳහා අනුමත කර අත්සන් කරමි ;

ඉංජි.ජී.ඩී.ඩී. පියතිලක
**සභාපති**

එස් පී පි නානයක්කාර
**අධ්‍යක්ෂ**

2018 දෙසැම්බර් 04 වැනි දින
කොළඹ

## සමකොටස් වෙනස් වීමේ ප්‍රකාශනය

| | ඉකාපිමඋකා | | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | දායක ප්‍රාග්ධනය රු. | ප්‍රාග්ධන සංචිත රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 4,744,367,819 | **4,747,895,819** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | | 439,663,403 | **439,663,403** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 20,282,110 | **20,282,110** |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 5,204,313,332 | **5,207,841,332** |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 5,204,313,332 | **5,207,841,332** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 401,305,256 | **401,305,256** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | (5,919,064) | **(5,919,064)** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **500,000** | **3,028,000** | **5,599,699,524** | **5,603,227,524** |

| | සමූහය | | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | දායක ප්‍රාග්ධනය රු. | ප්‍රාග්ධන සංචිත රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 4,952,476,936 | **4,956,004,936** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 524,220,763 | **524,220,763** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 20,297,204 | **20,297,204** |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 5,496,994,903 | **5,500,522,903** |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 5,496,994,903 | **5,500,522,903** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | | 522,183,174 | **522,183,174** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | (6,529,540) | **(6,529,540)** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **500,000** | **3,028,000** | **6,012,648,538** | **6,016,176,538** |

පිටු අංක 28 සිට 36 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සමූහය | | ඉකාපිමඋකා | |
|---|---|---|---|---|
| **දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා** | **2017**<br>රු. | **2016**<br>රු. | **2017**<br>රු. | **2016**<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභය | **915,042,308** | 926,043,990 | **756,651,538** | 815,819,952 |
| **ගැලපීම්:** | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල ක්‍රමක්ෂය | **341,735,552** | 349,758,461 | **188,697,441** | 208,416,548 |
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම | **133,851,153** | 216,792,372 | **127,634,446** | 210,702,562 |
| බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රත්‍යාවර්තනය | **(35,000,000)** | (134,410,740) | **(35,000,000)** | (130,120,258) |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම්/(ප්‍රත්‍යාවර්තනය) | **35,910,237** | 28,667,377 | **33,418,940** | 28,186,313 |
| ශුද්ධ මූල්‍ය ආදායම | **(419,615,611)** | (260,463,722) | **(306,754,804)** | (204,404,707) |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේ **(ලාභ)/අලාභ** | -<br>**25,577** | (10,563,480) | **(342,369)** | (5,719,648) |
| **"කාරක ප්‍රාග්ධන වෙනස්වීමවලට පෙර මෙහෙයුම් ලාභය"** | **971,949,217** | 1,115,824,259 | **764,305,192** | 922,880,761 |
| බඩු වට්ටෝරු (වැඩිවීම)/අඩුවීම | **(47,792,051)** | (190,375,089) | **6,219,432** | 75,633,401 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ (වැඩිවීම)/අඩුවීම | **(3,392,014,946)** | (2,630,441,263) | **(3,480,112,652)** | (1,651,016,359) |
| සම්බන්ධිත සමාගම්වලින් හිඟව පවතින මුදල් වැඩිවීම/(අඩුවීම) | 0 | | **(194,551,833)** | (223,603,876) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ (වැඩිවීම)/අඩුවීම | **2,831,793,227** | 2,415,627,019 | **3,035,989,911** | 1,189,147,596 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්** | **363,935,446** | 710,634,925 | **131,850,049** | 313,041,523 |
| ගෙවන ලද පොළී | **(26,342,723)** | (22,135,246) | **(9,753,126)** | (6,263,475) |
| ගෙවන ලද බදු | **(391,308,423)** | (200,458,436) | **(368,844,159)** | (179,132,891) |
| ගෙවන ලද පාරිතෝෂික | **(34,683,325)** | (27,764,111) | **(34,683,325)** | (27,755,450) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **(88,399,024)** | 460,277,133 | **(281,430,561)** | 99,889,707 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍යප්‍රවාහය** | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ආයෝජන | **(300,348,314)** | (157,028,151) | **(71,917,615)** | (30,958,688) |
| සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් වල ආයෝජන | **(9,385,324)** | (13,102,338) | **-** | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීම මත විකුණුම් ලැබීම් | **21,181,405** | 13,702,671 | **19,875,859** | 6,067,772 |
| දීර්ඝ කාලීන තැන්පතු ආයෝජන/බැහැරකිරීම | **(12,628,025)** | 988,039 | **(14,160,467)** | (2,703,815) |
| කෙටි කාලීන තැන්පතු ආයෝජන/බැහැරකිරීම | **(13,178,100)** | (739,505,984) | **52,175,432** | (464,660,405) |
| ආයෝජන ආදායම | **445,958,333** | 282,598,968 | **316,507,931** | 210,668,182 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **131,599,977** | (612,346,795) | **302,481,141** | (281,586,955) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රවාහය** | | | | |
| මූල්‍ය කල්බදු බැරකම් ගෙවීම | **-** | (883,827) | **-** | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය | **-** | (883,827) | **-** | - |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **43,200,953** | (152,953,490) | **21,050,580** | (181,697,248) |
| **ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | **648,439,480** | 801,392,970 | **440,730,586** | 622,427,835 |
| **අවසානයේදී මුදල් හා සමාන දෑ (සටහන 20)** | **691,640,433** | 648,439,480 | **461,781,166** | 440,730,586 |

වරහන් තුල ඇති අගයන්ගෙන් අඩුකිරීම් නිරූපණය කෙරේ

28 to 36

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | ආයතනය | |
|---|---|---|---|---|
| | 2017<br>රු. | 2016<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
| **9 ආදායම** | | | | |
| ඉදිකිරීම් ආදායම | **12,806,742,018** | 9,562,536,642 | **10,768,630,876** | 8,209,198,474 |
| උපදේශන ආදායම | **2,402,881,988** | 2,112,033,861 | **2,427,006,622** | 2,124,082,347 |
| | **15,209,624,006** | 11,674,570,503 | **13,195,637,498** | 10,333,280,821 |
| **10 විකුණුම් පිරිවැය** | | | | |
| ඉදිකිරීම් පිරිවැය | **11,675,869,253** | 8,479,188,921 | **10,415,157,725** | 7,790,481,593 |
| උපදේශන පිරිවැය | **1,636,486,240** | 1,374,627,417 | **1,660,556,930** | 1,389,337,330 |
| | **13,312,355,493** | 9,853,816,338 | **12,075,714,656** | 9,179,818,923 |
| **11 වෙනත් ආදායම්** | | | | |
| විවිධ ආදායම් | **86,727,323** | 71,354,350 | **71,082,503** | 62,430,692 |
| කුලියට දීමේ ආදායම් | **10,362,049** | 6,266,318 | **38,144,281** | 37,526,306 |
| ජ./නොවන වත්කම් බැහැර කිරීමෙන් ලත් ආදායම් | **350,827** | 5,785,636 | **350,826** | 5,785,636 |
| ප්‍රතිපූර්ණය කළහැකි පිරිවැය | **-** | - | **33,411,513** | 35,913,113 |
| විදේශ ලාභ හෝ අලාභ | **1,770,074** | 1,154,382 | **1,770,074** | 1,154,382 |
| බොල් ණය වෙන්කිරීම් ප්‍රත්‍යාවර්තනය | **35,000,000** | 134,410,740 | **35,000,000** | 130,120,258 |
| | **134,210,273** | 218,971,425 | **179,759,198** | 272,930,388 |
| **12 ශුද්ධ මූල්‍ය ආදායම්** | | | | |
| **මූල්‍ය ආදායම්** | | | | |
| පොළී ආදායම් | **445,958,333** | 282,598,968 | **316,507,931** | 210,668,182 |
| | **445,958,333** | 282,598,968 | **316,507,931** | 210,668,182 |
| **මූල්‍ය පිරිවැය** | | | | |
| **මූල්‍ය පිරිවැය** | **(26,342,723)** | (22,135,246) | **(9,753,126)** | (6,263,475) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **419,615,611** | 260,463,722 | **306,754,804** | 204,404,707 |
| **14 ආදායම් බදු** | 392,098,907 | 397,620,085 | 355,346,282 | 376,156,549 |
| 14.1 වර්තමාන බදු වියදම් | 760,227 | 4,203,142 | - | - |
| විලම්භිත බදු වියදම් | **392,859,134** | **401,823,227** | **355,346,282** | **376,156,549** |
| **14.2 ගිණුම්කරණ ලාභය බදුකරණ ලාභයට සැසඳීම** | | | | |
| ඉදිකිරීම ආදායම මත බදු 12% | 11,294,687 | 27,050,366 | 11,294,687 | 27,050,366 |
| වෙනත් ආදායම් මත බදු 28% | 233,571,118 | 203,776,311 | 196,818,493 | 182,312,775 |
| විලම්භිත බදු | 147,233,101 | 166,793,408 | 147,233,101 | 166,793,408 |
| **වර්තමාන ආදායම් බදු වියදම්** | **392,098,907** | **397,620,085** | **355,346,282** | **376,156,549** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

## 15 දේපළ පිරියත සහ යන්ත්‍රෝපකරණ

### 15.1 ඉකාපිමළකා

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | ඉඩම් | ගොඩනැගිලි | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | පිරියත සහ යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | පිරියත සහ යන්ත්‍රෝපකරණ | කන්ටේනර | පරිගණක | මෝටර් වාහන | පුස්තකාල පොත් | කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | | | | | |
| 2016 ජනවාරි 1 දිනට ශේෂය | 1,701,736,867 | 820,129,995 | 67,037,896 | 223,719,126 | 72,639,548 | 502,540,042 | 12,380,896 | 144,675,350 | 382,708,511 | 1,776,940 | 19,331,449 | 3,948,676,619 |
| වර්ෂය තුල එකතු කිරීම් | 6,149,578 | 36,104,934 | 4,417,967 | 2,227,006 | 8,438,717 | 1,068,430 | - | 9,902,354 | 3,395,210 | 213,418 | - | 71,917,615 |
| වර්ෂය තුල බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (132,765) | (104,094) | (614,955) | (2,613,863) | - | (984,592) | - | - | (19,331,449) | (23,781,718) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,707,886,445 | 856,234,929 | 71,323,099 | 225,842,037 | 80,463,310 | 500,994,609 | 12,380,896 | 153,593,111 | 386,103,721 | 1,990,358 | - | 3,996,812,515 |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | | | | | | | | | | |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | - | 303,173,342 | 36,333,855 | 181,174,824 | 42,026,463 | 387,844,388 | 12,115,525 | 105,409,263 | 370,548,485 | 1,026,776 | - | 1,439,652,920 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | 67,698,817 | 8,151,267 | 14,691,928 | 8,627,247 | 66,382,497 | 250,017 | 15,498,587 | 7,171,782 | 225,297 | - | 188,697,441 |
| වර්ෂය තුළ බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (93,892) | (104,094) | (468,368) | (2,597,281) | - | (984,592) | - | - | - | (4,248,229) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **370,872,159** | **44,391,229** | **195,762,658** | **50,185,342** | **451,629,604** | **12,365,543** | **119,923,258** | **377,720,267** | **1,252,073** | **-** | **1,624,102,133** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | | | | | | |
| **2016 ජනවාරි 1 දිනට ශේෂය** | 1,701,736,867 | 516,956,653 | 30,704,042 | 42,544,302 | 30,613,085 | 114,695,655 | 265,371 | 39,266,086 | 12,160,026 | 750,164 | 19,331,449 | 2,509,023,699 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,707,886,445 | 485,362,770 | 26,931,870 | 30,079,379 | 30,277,968 | 49,365,006 | 15,353 | 33,669,853 | 8,383,454 | 738,285 | - | 2,372,710,383 |

## 15 දේපළ පිරියත සහ යන්ත්‍රෝපකරණ

### 15.2 සමූහය

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | ඉඩම් | ගොඩනැගිලි | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | පිරියත සහ යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | පිරියත සහ යන්ත්‍රෝපකරණ | කන්ටේනර | පරිගණක | මෝටර් වාහන | පුස්තකාල පොත් | කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | | | | | |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | 1,710,152,014 | 876,854,429 | 84,887,422 | 380,413,486 | 96,897,579 | 704,353,506 | 28,190,362 | 179,751,121 | 770,345,431 | 2,224,110 | 43,553,168 | 4,877,622,626 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 6,149,578 | 37,449,525 | 10,184,136 | 97,533,255 | 21,074,342 | 79,843,618 | 15,773,550 | 24,440,351 | 6,990,210 | 909,748 | 9,385,324 | 309,733,637 |
| වර්ෂය තුළ බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (185,655) | (909,841) | (772,061) | (4,328,257) | - | (2,239,392) | - | - | (19,331,449) | (27,766,655) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,716,301,592 | 914,303,954 | 94,885,903 | 477,036,900 | 117,199,860 | 779,868,867 | 43,963,912 | 201,952,080 | 777,335,641 | 3,133,858 | 33,607,043 | 5,159,589,608 |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | | | | | | | | | | |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | - | 318,940,293 | 41,327,105 | 246,860,886 | 49,161,807 | 479,884,957 | 21,136,040 | 119,294,827 | 694,062,513 | 1,043,163 | - | 1,971,711,591 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | 71,213,812 | 10,744,654 | 63,013,504 | 13,336,500 | 112,588,237 | 7,436,517 | 24,000,023 | 39,162,722 | 239,583 | - | 341,735,552 |
| වර්ෂය තුළ බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (116,170) | (626,952) | (551,450) | (3,265,319) | - | (1,999,782) | - | - | - | (6,559,673) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **390,154,104** | **51,955,589** | **309,247,438** | **61,946,857** | **589,207,875** | **28,572,557** | **141,295,068** | **733,225,235** | **1,282,746** | **-** | **2,306,887,470** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | | | | | | |
| **2016 ජනවාරි 1 දිනට ශේෂය** | 1,710,152,014 | 557,914,136 | 43,560,317 | 133,552,600 | 47,735,771 | 224,468,549 | 7,054,322 | 60,456,294 | 76,282,918 | 1,180,946 | 43,553,168 | 2,905,911,035 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,716,301,592 | 524,149,849 | 42,930,313 | 167,789,461 | 55,253,003 | 190,660,992 | 15,391,355 | 60,657,012 | 44,110,406 | 1,851,112 | 33,607,043 | 2,852,702,139 |

* සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්වලට අනුබද්ධිත ආයතනය (මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම) තුළදී සංවර්ධනය කරන ලද මෘදුකාංගවල පිරිවැය ඇතුලත් වේ. විස්තර පහත පරිදි වේ.

| | 2017.12.31 දිනට | 2017.12.31 දිනට |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 4,785,714 | 2,785,714 |
| වර්ෂය තුළදී දරන ලද පිරිවැය | 4,580,000 | 2,000,000 |
| | **9,365,714** | **4,785,714** |

## ඉංජනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | ඉකාපිමඋකා | |
|---|---|---|---|---|
| | 2017 රු. | 2016 රු. | 2017 රු. | 2016 රු. |
| **16 ආයෝජන** | | | | |
| දීර්ඝ කාලීන ආයෝජන (සටහන 16.1) | **51,117,849** | 38,489,824 | **61,117,869** | 46,957,402 |
| කෙටි කාලීන ආයෝජන (සටහන 16.2) | **4,094,534,947** | 4,081,356,846 | **2,983,463,922** | 3,035,639,354 |
| | **4,145,652,796** | 4,119,846,670 | **3,044,581,791** | 3,082,596,756 |
| **16.1 දීර්ඝ කාලීන ආයෝජන** | | | | |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම් | | | | |
| ස්ථාවර තැන්පත් වල ආයෝජන | **49,117,849** | 36,489,824 | **49,117,849** | 34,957,382 |
| විකිණීමය ඇති මූල්‍ය වත්කම් | | | | |
| කොටස්වල ආයෝජන | **2,000,000** | 2,000,000 | **2,000,000** | 2,000,000 |
| | **51,117,849** | 38,489,824 | **51,117,849** | 36,957,382 |
| අනුබද්ධිත ආයතන වල ආයෝජන (අප්‍රකාශිත) | | | | |
| මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම | **-** | - | **10,000,020** | 10,000,020 |
| | **-** | - | **10,000,020** | 10,000,020 |
| | **51,117,849** | 38,489,824 | **61,117,869** | 46,957,402 |
| **16.2 කෙටි කාලීන ආයෝජන** | | | | |
| රෙපෝ | **10,000,000** | 58,749,548 | **10,000,000** | 58,749,548 |
| කෙටි කාලීන ආයෝජන | **4,084,534,947** | 4,022,607,298 | **2,973,463,922** | 2,976,889,806 |
| | **4,094,534,947** | 4,081,356,846 | **2,983,463,922** | 3,035,639,354 |
| **17 බඩු වට්ටෝරු** | **832,849,205** | 785,057,154 | **10,638,501** | 16,857,933 |
| **18 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ** | | | | |
| වෙළඳ ලැබිය යුතු දේ (සටහන 18.1) | **14,359,088,555** | 11,144,567,276 | **11,114,025,430** | 8,051,064,521 |
| වෙනත් ලැබිය යුතු දේ (සටහන 18.2) | **107,228,112** | 74,425,943 | **65,471,318** | 56,874,387 |
| තැන්පතු, පෙරගෙවීම් සහ අත්තිකාරම් (සටහන 18.3) | **312,685,748** | 266,845,402 | **3,221,424,597** | 2,905,504,230 |
| | **14,779,002,414** | 11,485,838,621 | **14,400,921,345** | 11,013,443,138 |
| **18.1 වෙළඳ ලැබිය යුතු දේ** | | | | |
| ණයකරුවන් | **9,241,972,617** | 6,838,763,494 | **8,475,707,071** | 5,863,186,580 |
| සේවාදායකයින්ගෙන් හිඟ | **3,446,997,122** | 2,876,396,109 | **1,166,933,362** | 940,101,284 |
| රඳවාගත් ලැබිය යුතු දේ | **3,055,459,146** | 2,715,896,852 | **2,840,665,241** | 2,524,422,456 |
| අඩුකලා - අගය අඩුවීම සඳහා වෙන්කිරීම් (සටහන 18.1.1) | **(1,385,340,330)** | (1,286,489,179) | (1,369,280,245) | (1,276,645,799) |
| | **14,359,088,555** | 11,144,567,276 | **11,114,025,430** | 8,051,064,521 |
| **18.1.1 අගය අඩුවීම සඳහා වෙන්කිරීම්** | | | | |
| ආරම්භයේදී ශේෂය | **1,286,489,178** | 1,221,474,256 | **1,276,645,799** | 1,213,430,205 |
| හඳුනාගත් අලය අඩුවීමේ අලාභය | **133,851,153** | 216,792,372 | **127,634,446** | 210,702,562 |
| කපාහල/ප්‍රතිස්ථාපිත ප්‍රමාණය | **(35,000,000)** | (151,777,449) | **(35,000,000)** | (147,486,967) |
| වර්ෂය අවසානයේදී ශේෂය | **1,385,340,330** | 1,286,489,179 | **1,369,280,245** | 1,276,645,799 |

වාර්තාකරණ දිනට වෙළඳ ලැබිය යුතු දෑවල අගය අඩුවිමක් සිදු වී ඇති බවට සාධනීය සාක්ෂියක් තිබේද යන්න සමූහය විසින් ඇගයීමට ලක් කරනු ලැබේ. පවත්නා ලැබිය යුතු දෑවල සහ ඓතිහාසික එකතු කිරීමේ අත්දැකීම්වල වත්මන් තත්ත්වය පිළිබඳ සමාලෝචනයක් මත පදනම්ව අගය අඩුවීමේ අලාභය ගණනය කෙරේ. සත්‍ය සහ අපේක්ෂිත අගය අඩු වීම පිළිබිඹු කිරීම සඳහා එවැනි වෙන්කිරීම් වරින් වර ගැලපනු ලැබේ.

| | සමූහය 2017 රු. | සමූහය 2016 රු. | ඉකාපිමඋකා 2017 රු. | ඉකාපිමඋකා 2016 රු. |
|---|---|---|---|---|
| **18.2 වෙනත් ලැබිය යුතු දේ** | | | | |
| කාර්ය මණ්ඩල ණය | **37,481,440** | 35,664,283 | **36,913,705** | 35,664,283 |
| පෙරගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | **4,372,592** | 3,624,582 | **4,372,592** | 3,624,582 |
| පොදු අවිනිශ්චිතතා | **64,747,403** | 34,433,470 | **23,558,344** | 16,891,443 |
| විවිධ ණයගැතියන් | **626,677** | 703,608 | **626,677** | 694,079 |
| WHT ලැබිය යුතු දේ | **107,228,112** | 74,425,943 | **65,471,318** | 56,874,387 |
| **18.3 තැන්පතු, පෙරගෙවීම් සහ අත්තිකාරම්** | | | | |
| තැන්පතු | **15,869,689** | 13,294,380 | **10,041,455** | 9,539,091 |
| යෙදවීමේ අත්තිකාරම් | **41,334,292** | 47,878,609 | **3,167,826,373** | 2,862,914,925 |
| අත්තිකාරම් | **238,032,937** | 186,029,459 | **36,012,267** | 24,369,808 |
| පෙර ගෙවීසම් | **17,448,830** | 19,642,954 | **7,544,502** | 8,680,405 |
| | **312,685,748** | 266,845,402 | **3,221,424,597** | 2,905,504,230 |
| **19 සම්බන්ධිත පාර්ශව සමාගම්වලින් හිඟ** | | | | |
| මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම | **-** | - | **1,565,621,738** | 1,371,069,905 |
| | **-** | - | **1,565,621,738** | 1,371,069,905 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | ඉකාපිමඋකා | |
|---|---|---|---|---|
| | 2017 රු. | 2016 රු. | 2017 රු. | 2016 රු. |
| **20 මුදල් සහ මුදල් හා සමාන දේ** | | | | |
| හිතකර ශේෂයන් | | | | |
| අතේ සහ බැංකුවේ ඇති මුදල් | **672,602,070** | 625,895,435 | **443,083,574** | 430,012,186 |
| බැංකු අග්‍රිම | **269,607** | 269,607 | **269,607** | 269,607 |
| සංක්‍රමණයෙහි ඇති මුදල් | **18,768,755** | 22,274,438 | **18,427,985** | 10,448,793 |
| මුදල් ප්‍රවාහ අවශ්‍යතාවය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ | **691,640,433** | **648,439,480** | **461,781,166** | **440,730,585** |
| **21 කල්බදු ණයහිමියන්** | | | | |
| එක් වර්ෂයක් තුල ගෙවිය යුතු වටිනාකම | - | - | - | - |
| එක් වර්ෂයකට පසුව ගෙවිය යුතු වටිනාකම | - | - | - | - |
| | - | - | - | - |
| **22 සේවක ප්‍රතිලාභ** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **158,063,895** | 177,457,833 | **156,587,664** | 176,438,911 |
| වර්ෂය සඳහා වෙන්කිරීම | **35,910,237** | 28,667,377 | **33,418,940** | 28,186,313 |
| | **6,529,540** | (20,297,204) | **5,919,064** | (20,282,110) |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | **(34,683,325)** | (27,764,111) | **(34,683,325)** | (27,755,450) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **165,820,347** | **158,063,895** | **161,242,343** | **156,587,664** |

a) 2016 දෙසැම්බර් 31 වැනි දිනට මඉඋකා සහ සමූහයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්, වෘත්තීය සුදුසුකම් සහිත ආයුගණක ආයතනයක් වන සීමාසහිත ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්.) සමාගම මඟින් සිදු කරන ආයුගණක තක්සේරු මත පදනම් වේ. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 වැනි දිනට ඉකාපිමඋකා සහ සමූහයෙහි අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමෙහි අරමුදල් නොලැබූ වර්තමාන වටිනාකම රු.මිලියන 158කි.

b) **ගණනය කිරීමේදී යොදාගත් ප්‍රධාන උපකල්පන පහත දක්වා ඇත;**

| | සමූහය 2017 | සමූහය 2016 | ඉකාපිමඋකා 2017 | ඉකාපිමඋකා 2016 |
|---|---|---|---|---|
| වට්ටම් අනුපාතය | **11%** | 11% | **11%** | 11% |
| සේවක පිරිවැටුම් සාධකය | **0.01% - 0.18%** | 0.01% - 0.18% | **0.01% - 0.18%** | 0.01% - 0.18% |
| විශ්‍රාම ගැන්වීමේ වයස | **60 Years** | 60 Years | **60 Years** | 60 Years |

C) **අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම සඳහා වියදම්**

| | සමූහය 2017 | සමූහය 2016 | ඉකාපිමඋකා 2017 | ඉකාපිමඋකා 2016 |
|---|---|---|---|---|
| පොළී පිරිවැය | **17,372,266** | 17,681,182 | **17,224,643** | 17,643,891 |
| වර්තමාන සේවා පිරිවැය | **18,537,971** | 10,986,195 | **16,194,297** | 10,542,422 |
| වහාම හඳුනාගත් ශුද්ධ ආයුගණක ලාභ/(අලාභ) | **6,529,540** | (20,297,204) | **5,919,064** | (20,282,110) |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වහාම හඳුනාගත් වියදම් | **42,439,777** | **8,370,173** | **39,338,004** | **7,904,203** |

## ඉංජනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

| | සමූහය | | ඉකාපිමඋකා | |
|---|---|---|---|---|
| **දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා** | **2017**<br>රු. | **2016**<br>රු. | **2017**<br>රු. | **2016**<br>රු. |
| **23 විලම්භිත බදු** | | | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | **21,820,956** | 17,617,814 | - | - |
| වර්ෂය තුළ වෙන්කිරීම් | **760,227** | 4,203,142 | - | - |
| වර්ෂය අවසානයේදී ශේෂය | **22,581,183** | 21,820,955 | | |
| **24 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| වෙළඳ ගෙවිය යුතු දේ (සටහන 24.1) | **15,479,423,962** | 12,486,695,002 | **14,731,952,617** | 11,768,254,216 |
| වෙනත් ගෙවිය යුතු දේ (සටහන 24.2) | **645,451,104** | 806,386,837 | **424,940,945** | 352,649,434 |
| | **16,124,875,069** | **13,293,081,842** | **15,156,893,565** | **12,120,903,650** |
| **24.1 වෙළඳ ගෙවිය යුතු දෑ** | | | | |
| ණයහිමියන් | **3,334,457,509** | 2,929,131,100 | **5,338,238,467** | 4,061,207,167 |
| ගණුදෙනුකරුවන්ට හිඟ | **6,840,692,367** | 4,674,673,186 | **3,514,238,015** | 2,400,071,753 |
| සේවයේ යෙදවීමේ සහ වෙනත් අත්තිකාරම් | **4,744,736,743** | 4,418,734,914 | **3,877,389,406** | 3,864,822,978 |
| කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවාගැනීම් | **559,537,342** | 464,155,803 | **2,002,086,729** | 1,442,152,319 |
| | **15,479,423,962** | **12,486,695,002** | **14,731,952,617** | **11,768,254,216** |
| **24.2 වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| නොගෙවූ වැටුප් | **636,773** | 964,983 | **144,009** | 214,870 |
| විවිධ ණයහිමියන් | **60,354,494** | 51,829,482 | **47,546,107** | 47,498,952 |
| ගෙවිය යුතු තැන්පත් | **8,122,232** | 8,538,310 | **8,122,232** | 8,437,970 |
| උපචිත වියදම් | **274,972,227** | 505,205,680 | **201,362,694** | 201,586,760 |
| PAYE බදු | - | - | - | - |
| වෙනත් බදු | **8,535,505** | 5,915,352 | **6,523,995** | 5,251,890 |
| | **292,829,873** | 233,933,030 | **161,241,909** | 89,658,992 |
| | **645,451,104** | **806,386,837** | **424,940,945** | **352,649,434** |
| **25 ගෙවිය යුතු ආදායම් බදු** | | | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | **971,603,364** | 774,441,715 | **948,389,368** | 751,365,710 |
| වර්ෂය සඳහා ආදායම් බදු | **392,098,907** | 397,620,085 | **355,346,282** | 376,156,549 |
| වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | **(363,727,664)** | (183,500,000) | **(345,542,500)** | (165,000,000) |
| රැඳවුම් බදු | **(27,580,759)** | (16,958,436) | **(23,301,659)** | (14,132,891) |
| වර්ෂය අවසානයේදී ශේෂය | **972,393,849** | **971,603,364** | **934,891,491** | **948,389,368** |

**ප්‍රාග්ධන සංචිත**

1995 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ප්‍රාග්ධන සංචිත යටතේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

### දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**27.0 අනුබද්ධිත ආයතන සමඟ ගනුදෙනු**

**27.1**

a) ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා ප්‍රධාන ආයතනයේ (ඉකාපිමඋකා) සහ සමූහයේ අනුබද්ධිත ආයතනයේ (මඉසේස) සභාපති වන අතර 2016 දෙසැම්බර් 31 වැනි දිනට මඉඋකා හි අධ්‍යක්ෂවරුන් වූ එම්.ආර්.ජී.රණතුංග, ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහත්වරුන් මඉසේස හි ද අධ්‍යක්ෂවරුන්ද විය.සමාගම සමාලෝචිත වර්ෂය තුළදී මඉඋකා සමඟ ගනුදෙනු සිදු කර ඇති අතර විස්තර පහත දක්වා ඇත;

**තවද, ඉකාපිමඋකා හි ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන්නන් මෙන්ම මඉසේස හි අධ්‍යක්ෂවරයන්ද වන පුද්ගලයන් පහත පරිදි වේ.**

| නම | තනතුර | |
|---|---|---|
| | ඉකාපිමඋකා | මඉසේස |
| ඉංජි. කේ.එල්.එස්.සහබන්දු | සාමාන්‍යාධිකාරි | අධ්‍යක්ෂ |
| ඉංජි. ටී.ඩී.වික්‍රමරත්න | ඒකාබද්ධ සාමාන්‍යාධිකාරි (උපදේශන) | අධ්‍යක්ෂ |
| ඉංජි. ඒ.ගල්කැටිය | ඒකාබද්ධ සහකාර සාමාන්‍යාධිකාරි | අධ්‍යක්ෂ |
| යූ.එන්.බී.මාවතගම මයා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -මුදල් | අධ්‍යක්ෂ |

b)

| ගනුදෙනුවල ස්වභාවය | වටිනාකම | |
|---|---|---|
| | 2017<br>රු. | 2016<br>රු. |
| උප කොන්ත්‍රාත් පිරිවැය | 10,256,040,492 | 7,332,478,747 |
| යන්ත්‍රසූත්‍ර කුලියට ගැනීමේ වියදම් | 36,754,093 | 33,133,098 |
| වාහන කුලියට ගැනීමේ වියදම් | 14,137,611 | 17,747,240 |
| IT නඩත්තු සහ වෙනත් සේවාවන් | 10,920,584 | 11,499,743 |
| වැටුප් ගෙවීමේ ප්‍රතිපූර්ණය කිරීමේ පිරිවැය | 33,411,513 | 35,913,113 |
| උපදේශන ගාස්තු | 13,704,051 | 12,048,485 |
| වෙනත් විවිධ සේවාවන් | 43,097,286 | 3,718,832 |

**27.2 සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනුවල නියමයන් සහ කොන්දේසි**

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ආදායම් සහ දරනු ලැබූ වියදම් හෝ සම්බන්ධිත පාර්ශවවලින් මිලදීගැනීම් නිදහස් ගනුදෙනු සඳහා මේ වනවිට පවතින නියමයන් වලට සමාන නියමයන්වලට වාර්තා කරනු ලැබේ. වර්ෂ අවසානයට පවතින හිඟ ශේෂයන් නොසුරැකුණු, පොළියෙන් නිදහස් සහ නිරවුල් කිරීම මුදලින් සිදු වේ. කිසිදු සම්බන්ධිත පාර්ශව ලැබීම් හෝ ගෙවීම් සඳහා වගකීම් ලබා දී හෝ ලැබී නොමැත. මෙම සටහන, මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 19 සමඟ කියවිය යුතුය.

**ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු**

LKAS 24 'සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම්, ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මඟපෙන්වීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම පවතින පුද්ගලයින් ප්‍රධාන කළමනාකරණ පිරිස වේ.ඒ අනුව, මඉඋකා/සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස වන අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්) ප්‍රධාන කළමනාකරණ පිරිස ලෙස වර්ගීකරණය කර ඇත.

| | ඉකාපිමඋකා | | මඉසේස | |
|---|---|---|---|---|
| | 2017<br>රු. | 2016<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
| **ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද වන්දි** | | | | |
| වැටුප් සහ වෙනත් රැකියා ප්‍රතිලාභ | 3,171,000 | 3,293,250 | 1,722,500 | 1,730,000 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

2017 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**28 වගකීම් සහ අවිනිශ්චිතතා**

වාර්තාකරණ දිනට ඉකාමඋකා/සමූහය සතුව සැලකිය යුතු වගකීම්

**28.1 අවිනිශ්චිතතා**

**අ) ඉකාමඋකා ට එරෙහිව ගොනු කර ඇති නඩු**

**ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC (Special LA) 48/2017**

නඩු අංක **MR$** 8748 සම්බන්ධයෙන් මාතලේ, දිස්ත්‍රික් උසාවිය විසින් 2014.05.16 වැනි දින ඉකාමඋකා එරෙහිව තීන්දුක් ලබා දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් අභියාචනා මහාධිකරණයේ අභියාචනයක් ගොනු කරන ලදී. (එච්.බී.ආර්.එස්.දිද්දෙණිය සහ ඩී.ජේ.ඩී.පී.ඉන්ද්‍රසිරි යන අය විසින් දඹුල්ල-කණ්ඩලම මාර්ගය අසල පිහිටි ඔවුන්ගේ නිවසට සිදු වූ අලාභහානි වෙනුවෙන් රු. 8,000,000.00ක වන්දියක් ඉල්ලා සිටී. වන්දියක් වශයෙන් රු.3,000,000.00 ගෙවීමට තීන්දුව ලබා දෙන ලදී. ඉහත තීන්දුව සම්බන්ධයෙන් නඩු අංක **FA** 11/2015 යටතේ මහනුවර පළාත් අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනු කරන ලද අතර මාතලේ දිස්ත්‍රික් උසාවියේ තීන්දුව සහතික කරන ලද අතර අභියාචනය නිෂ්ප්‍රභ කරන ලදී. එබැවින් පළාත් අභියාචනාධිකරණයේ තීන්දුව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනයක් ගොනු කර ඇත.
වෘත්තීමය උපදෙස් ලබා ගැනීමෙන් පසු 2017.12.31 වැනි දින රු. 3,000,000.00ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී.

**නඩු අංක 296/ හානි දිස්ත්‍රික් උසාවිය, අම්පාර**

ඉකාමඋකා වාහනයක් මගින් සිදු වූ රිය අනතුරකින් මිය ගිය පුතණුවන් වෙන්වෙන් සී.සමන්ත නන්ද සිල්වා රු. 2,500,000.00 ක් වන්දි මුදලක් ඉල්ලා සිටී.

**නඩු අංක 155/හානි හානි දිස්ත්‍රික් උසාවිය, කඩුවෙල**

ඉකාමඋකා ඉදිකිරීම් වැඩපොළකින් පතිත වූ ඉදිකිරීම් ද්‍රව්‍ය හේතුවෙන් ඔවුන්ගේ විදුලි ජනක යන්ත්‍රයට හානි සිදු වූයේ යැයි පවසමින් රු.1,664,677.00ක් ගෙවන මෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය ඉල්ලා ඇත. එවැනි ද්‍රව්‍යය ඉකාමඋකා ඉදිකිරීම් කාර්යයන් සඳහා යොදා ගෙන නොමැති බැවින් ඉකාමඋකා නඩුව විසංවාදී කරමින් පවතී.

**නඩු අංක 155/හානි හානි දිස්ත්‍රික් උසාවිය, කොළඹ**

ඉංජි. ඩබ්.කේ.පී.අයි. රුද්‍රිගෝ මහතා විසින් අපහාස නඩුවක් ගොනු කර ඇති අතර රු. 500,000,000.00 ක් වන්දි මුදලක් ලෙස ඉල්ලා සිටී.

**නඩු අංක 1820/13 ඩීඑම් ආර් දිස්ත්‍රික් උසාවිය, කොළඹ**

කම්කරු පිරිවැය ලෙස තුවාන් වම්සා කසීම් මහතා ඉකාමඉඋකා වෙතින් රු. 1,000,000.00 ක වන්දි මුදලක් ඉල්ලා සිටී.

**නඩු අංක බ 446 දිස්ත්‍රික් උසාවිය, වැලිමඩ**

මාර්ග සංවර්ධන අධිකාරියෙන් සහ ඉකාමඋකා වෙතින් වන්දි මුදලක් ලෙස මොහොමඩ් අලි අබ්දුල් හමීඩ් මහතා රු. 4,108,000 /ක් ඉල්ලා සිටී.

**ආ) ඉකාමඋකා විසින් ගොනු කර ඇති නඩු**

**නඩු අංක HCC ARB 208/2016 වාණිජ මහාධිකරණය, කොළඹ**

ජෙනරේටරයක් සඳහා සොආ ටෙක්නොලොජි (පෞද්.) සමාගමෙන් රු.1,708,000ක් ඉල්ලා සිටිමින් කාර්යාංශය විසින් මෙම නඩුව ගොනු කර ඇත.
නඩු අංක **DMR** 2677/16 දිස්ත්‍රික් උසාවිය, කොළඹ

කාර්යාංශය සමග අත්සන් කරන ලද ගිවිසුමට අනුව එම වගකීම ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රු. 257,326.67ක් ඉල්ලා කාර්යාංශය විසින් ඉංජි. කේ.ජී. සඳමාලී මෙයට එරෙහිව නඩුවක් ගොනු කර ඇත.

**ඉකාමඋකා සහ EN ව්‍යාපෘති අතර බේරුම්කරණය**

හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල, ඉදිකිරීම සම්බන්ධයෙන් ඉකාමඋකා සහ ඊඑ ප්‍රොජෙක්ට්ස් අතර ආරවුලක් ඇති වූ අතර රු. 100,748,377.93 ක හිඟ මුදලක් සහ රු.14,160,456.19 ක පොලියක් ඇතුළුව රු. 114,908,834.12ක් ඉල්ලා ඇත. (2017.10.17 දින තීරණය දැනුම් දී ඇති අතර බේරුම්කරණය සිදු කරමින් පවතී.නීතිමය උපදෙස් ලබා ගැනීමෙන් පසු, එම නඩු සඳහා කිසිදු වගකීමක් පැන නොනගිනු ඇතැයි කළමනාකාරිත්වය විශ්වාස කරයි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැත.

## 29 මූල්‍ය අවදානම් කළමනාකරණය

**සමාලෝචනය**

මූල්‍ය මෙවලම්වලින් පැන නඟින පහත සඳහන් අවදානම් සඳහා සමූහය නිරාවරණය වී ඇත.

ණය අවදානම

ද්‍රවශීලතා අවදානම

වෙළඳපොළ අවදානම

ඉහත එක් එක් අවදානම පිළිබඳව සමූහයේ නිරාවරණය වීම, සමූහයේ අවදානම කළමනාකරණ අරමුණු, අවදානම මැනීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සහ සමූහයේ ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ තොරතුරු සටහනෙන් ඉදිරිපත් කරයි.

### අවදානම් කළමනාකරණ රාමුව

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම හා අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්ථ වගකීම දරයි. සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත. කමිටුව, එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා වාර්තා කරනු ලැබේ.

සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්ට අනුකූලව කළමනාකාරිත්වය අධීක්ෂණය කරන ආකාරය පිළිබඳව විගණන හා කළමනාකරකමිටුව නිරීක්ෂණය කරන අතර සමූහය මුහුණ දෙන අවදානම සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණාත්මකභාවය පිළිබව සමාලෝචනය කරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ අධීක්ෂණ කාර්යාභාරය සඳහා අභ්‍යන්තර විගණන අංශය සහාය ලබා දෙයි. අභ්‍යන්තර විගණනය විසින් අවදානම් කළමනාකරණ ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටිවල නිතිපතා සහ තත්කාර්ය සමාලෝචන සිදු කරන අතර ඒවායේ ප්‍රතිඵල එහි විගණන හා කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

### 29.1 ණය අවදානම

ණය අවදානමක් යනු පාරිභෝගිකයෙකු හෝ මූල්‍ය මෙවලමක් සඳහා පාර්ශවකරුවෙකු ඔවුන්ගේ ගිවිසුම් බැඳීම් ඉටුකර ගැනීමට අපොහොසත් වුවහොත් එමඟින් සමූහයට මූල්‍ය අලාභයක් ඇතිවීමේ අවදානම වන අතර පාරිභෝගිකයින්ගෙන් සමූහයට ලැබිය යුතු දෑ මඟින් ප්‍රධාන වශයෙන් පැන නඟී.

### 29.2 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීම මගින් පියවා ගනු ලබන එහි සිය මූල්‍ය බැරකම් සමඟ සම්බන්ධිත බැඳීම් ඉටුකිරීමේදී සමූහයට අසීරුතාවයකට මුහුණ දීමට සිදුවීමේ අවදානමයි. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ සමූහයේ ප්‍රවේශය වන්නේ සාමාන්‍ය සහ ආතතික තත්ත්ව යටතේ අනුමත කළ නොහැකි අලාභ දරා නොගනිමින්, හැකි තාක් දුරට අවශ්‍ය වූ විට සිය වගකීම් ඉටු කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවතින බවට සහතික වීම වේ.

### 29.3 වෙළඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානමක් යනු වෙළඳපොළ මිල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණවල අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපොළ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණ වන්නේ ආදායම උපරිම ටම්මට කරා ඉහළ නංවා ගනිමින් පිළිගත හැකි පරාමිති තුළ වෙළඳපළ අවදානම් නිරාවරණය වීම් කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

වෙළඳපොළ අවදානම පහත සඳහන් අවදානම් වර්ගවලින් සමන්විත වේ.

**පොළී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් සාධාරණ අගය හෝ මූල්‍ය මෙවලමක අනාගත මුදල් ප්‍රවාහයන් උච්චාවචනය වීමට ඇති අවදානමයි.

**විදේශ විනිමය අවදානම**

විදේශ මුදල් අවදානම යනු විනිමය අනුපාතික වෙනස්වීම් හේතුවෙන් සාධාරණ අගය හෝ මූල්‍ය මෙවලමක අනාගත මුදල් ප්‍රවාහයන් උච්චාවචනය වීමට ඇති අවදානමයි. විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් අවදානමට සමූහය නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් විදේශ මෙහෙයුම්වලට අදාළ සමූහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වේ.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. සීඊඑන්/බී/සීඊසීබී/එෆ්ඒ/01/17/58 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018 දෙසැම්බර් 31 දින. |

සභාපති,

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) මූල්‍ය ප්‍රකාශන හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ("කාර්යංශය") මූල්‍ය ප්‍රකාශන හා කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

(අ). **තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

(ආ). **තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

(අ) ශ්‍රී. ල.වා.ප්‍ර. 7 - මූල්‍යමය උපකරණ හෙළිදරව් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එක් එක් වර්ගීකරණයන් යටතේ වූ මූල්‍යමය වත්කම් හා වගකීම් වල ධාරණ අගයහෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලං. ගි. ප්‍ර. 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ප්‍රමිතය අනුව ආයතනයේ ජංගම හා ජංගම නොවන වර්ගීකරණයට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලං. ගි. ප්‍ර. 12 - ආදායම් බදු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රමිතයේ පරිච්ඡේද අංක 81 (ජී) අනුව හඳුනාගත් කල්බදු වත්කම් හා වගකීම් ශේෂයන් සෑම ආකාරයේම තාවකාලික වෙනස්වීම් සෑම ආකාරයේම ප්‍රයෝජනයට නොගත් බදු අලාභයන් සහ බැර කිරීම් හෙළිදරව් කිරීම කල යුතු වේ. කෙසේ වුවද, ප්‍රමිතය අනුව වූ නියමයන් කාර්යාංශය හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලං. ගි. ප්‍ර. 32 - මූල්‍ය උපකරණ ඉදිරිපත් කිරීම

ප්‍රමිතය අනුව ආයතනය ඉදිරියට කළ ගෙවීම්, මුදලින් නොලැබුන හෝ අනෙකුත් මූල්‍යමය වත්කම් ලැබීමට අයිතිවාසිකමක් ලැබූ ලෙස සැලකිය නොහැක. එසේම ඉදිරියට කල වියදම් මූල්‍ය වත්කම් ලෙස සැලකිය නොහැක. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට රු. 7,544,502 ක්වූ ඉදිරියට කල ගෙවීම් මූල්‍යමය වත්කම් ලෙස සළකා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) මූලික කාර්යාල 02 කට අදාලව ණයගැතියන්ගෙන් ලැබිය යුතු රඳවාගැනීම් අත්තිකාරම් එකතුව රු. 11,433,011 ක බැර ශේෂය අදාල හර ශේෂයන්ට එරෙහිව කපාහැර තිබුණි. ඒ අනුව, වෙළඳ හා අනෙකුත් ලැබීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. එම නිසා වෙළඳ හා අනෙකුත් ගෙවීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. බත්තරමුල්ල මූලික කාර්යාලයේ රු.23,419,945 ක් වූ ණයහිමියන්ගේ හර ශේෂයන් ණයහිමියන්ට එරෙහිව කපා හැර තිබුණි.

ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2012 වර්ෂයේ මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු රු. මිලියන 3,351 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් ලෙස ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන, දේපල පිරියත හා උපකරණ රජයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද, 2017 ජනවාරි 01 දිනට යන්ත්‍ර හා උපකරණ නැවත අගය කර තිබුණු බව පෙර වර්ෂයේ වාර්තාවේ දක්වා තිබුණි. කෙසේ වුවද කාර්යාංශය එම වත්කම් 2017 වර්ෂය අවසානයටද නැවත අගය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අංශ දෙකකට අදාලව ලැබිය යුතු හා ගෙවිය යුතු එකතුව පිළිවෙළින් රු. 1,703,121,917 හා රු. 642,350,707 ක් වසර හතරකට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව හිඟ හිටව රැඳී

පැවති අතර ජාත්‍යන්තර අංශයේ ලැබිය යුතු ශේෂය වූ රු. 2,119,986 ක් 2017 දෙසැම්බර් 31 දිනට වසර දෙකකට වැඩි කාලයක් හිඟ හිටව රැඳී පැවතුණි.

### 2.2.4 හඳුනා නොගත් වෙනස්කම්

ලැබිය යුතු ශේෂයන්ට අදාලව මධ්‍යම පළාත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා කාර්යාංශය ලබාදුන් විස්තරාත්මක උපලේඛනයන් අතර රු. 17,095,967 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව පිළිවෙලින් රු.8,475,707,071ක් හා රු. 5,338,238,467 ක්වූ ණයගැතියන් හා ණයහිමියන්ට අදාළව ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කාර්යාංශය හා සමූහයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු. 401,305,256 ක් හා රු. 522,183,174 ක බදු පසු ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය පිළිවෙලින් රු. 439,663,403 ක් හා රු. 524,220,763 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පහත වැටීම පිළිවෙලින් රු.38,358,147 ක් හා රු. 2,037,589 ක් දැක්වුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු. 93,171,190 ක් අඩුවීම හා පරිපාලන වියදම් රු. 116,615,298 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අවාසිදායක තත්ත්වයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සමග පසුගිය වසර හතරක බදු පසු ශුද්ධ ලාභය සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු. 328,222,120 ක් වුවද 2017 වර්ෂයේදී බදු පසු ශුද්ධ ලාභය රු. 401,305,256 ක් වී තිබුණි. සේවක දීමනා, ක්ෂය හා බදු ගැලපුම් කළ පසු සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 2,356 ක අගයක් එකතු වී තිබුණි. පසුගිය වර්ෂයේ අගය වැඩිවීම රු. මිලියන 2,006 ක් විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සේවකයින් 1,350 ක පිරිස් බලයකින් යුත් එහි කාර්ය මණ්ඩලය හා රු. මිලියන 21,856 ක් වූ මුළු වත්කම් උපයෝජනය කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාංශය විසින් රු. මිලියන 756 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් උපයා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ඉපයීම මුළු වත්කම්වලින් සියයට 3.46 ක ප්‍රතිශතයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පිළිවෙලින් සියයට 3.4 ක් හා සියයට 3.04 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම ලාභ ආන්තික පිළිවෙලින් සියයට 2.5 ක් හා සියයට 1.2 කින් අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්යසාධනය

---

කාර්යංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ විදේශීය අංශයේ පාරිභෝගික තෘප්තිය උපරිම කිරීම, අපේක්ෂිත යටිතල පහසුකම් සංවර්ධනය ලභා කරගැනීම් හා නැගෙනහිර අප්‍රිකානු කලාපයේ ජල සම්පත් සංවර්ධනය වැනි අරමුණු ලභාකර ගෙන නොතිබුණි.

4.2 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පෙර වර්ෂයන්හීදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තිදෙනෙකුට නිල නිවාස තුනක් භාර දී තිබූ අතර ඔවුන් විසින් මාසික කුලිය ගෙවා නොතිබුණි. තවද ඔවුන් අතරින් එක් අයෙකු 2004 වර්ෂයේ සිට කුලී ගෙවා නොතිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි සේවකයන්ට දිරි දීමනා යෝජනා ක්‍රම කිහිපයක් අනුමත කර තිබුණි. 2017 වර්ෂය තුලදී එසේ ගෙවන ලද මුළු දිරි දීමනා මුදල රු. 67,027,249 ක් විය.

6

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණය

#### 5.1.1 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) කාර්යාංශයේ මූල්‍ය බලතල පැවරුම් ලේඛනය අනුව රු. මිලියන 02 ක ඉක්ම වූ ප්‍රසම්පාදනයන් සඳහා තරඟකාරී මිල ගණන් අදාල කරගත යුතු වේ. කෙසේ වුවද ප්‍රධාන කාර්යාලයේ ඉහත සීමාවන් ඉක්මවූ ප්‍රසම්පාදනයන් 06 ක් සඳහා මිල සැඳහුම් ක්‍රමය භාවිතා කර තිබුණි.

ආ) ප්‍රසම්පාදන අත්පොතේ අතිරේක 32 අනුව සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට කරන ලද ප්‍රසම්පාදනයන් සඳහා කමිටු සාමාජිකයින්ට ගෙවීම් කළ නොහැක. කෙසේ වුවද, ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ට රු. 53,000 ක ප්‍රසම්පාදන කමිටු දීමනා හා තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා වශයෙන් රු. 16,000 ක් ප්‍රසම්පාදන මඟපෙන්වීම් වලට පටහැනිව ගෙවා තිබුණි.

ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිමකළ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති 13 කට අදාලව අයකර නොගත් සචලීකරණ අත්තිකාරම් එකතුව වූ රු. 22,067,146 ක් ගිණුම් වල රැඳී තිබුණි. ව්‍යාපෘති නිමවුම් ප්‍රතිශතය සියයට 90 වන විට සචලීකරණ අත්තිකාරම් සම්පූර්ණයෙන් අයකර යුතු හෙයින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නිකුත් කල ඉක්ටැඩ්/ එස්බිඩී/ 02 හි 3 වන පරිච්ඡේදයේ 14.2(බී) වගන්තිය අනුව එම ශේෂය අසාමාන්‍ය විය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම හා තථ්‍ය වියදම අතර පරතරය 44 සිට 137 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති පාලන අඩුපාඩු මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | 2017 දෙසැම්බර් 31 දිනට වැඩ බිම්වල වූ ඉන්වෙන්ට්‍රි සහ ආපසු භාර දියයුතු තොග මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. |
| (ආ) | වත්කම් කළමනාකරණය | අමාත්‍යාංශයෙන් ලැබුණු ස්ථාවර වත්කම් ගිණුම් වලට ගෙන නොතිබුණි. |
| (ඇ) | ආදායම් කළමනාකරණය | උපදේශන සේවාවන්ට අදාල තථ්‍ය කළ වැඩ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |

එච්.එම්. ගාමිණි විජේසිංහ,

විගණකාධිපති.

# සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශනය

## ඉංජනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

**දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම | 15,132,718,158 | 15,131,164,037 | 13,401,582,667 | 13,259,699,366 | 11,423,636,967 | 10,710,472,734 | 11,674,570,503 | 10,333,280,821 | 15,209,624,006 | 13,195,637,498 |
| විකුණුම් පිරිවැය | (13,280,839,809) | (13,414,329,871) | (11,487,873,150) | (11,656,600,792) | (9,679,902,097) | (9,448,860,733) | (9,853,816,338) | (9,179,818,923) | (13,312,355,493) | (12,075,714,656) |
| දළ ලාභය | **1,851,878,349** | **1,716,834,166** | **1,913,709,517** | **1,603,098,574** | **1,743,734,870** | **1,261,612,002** | **1,820,754,165** | **1,153,461,898** | **1,897,268,513** | **1,119,922,842** |
| වෙනත් ආදායම් | 153,445,158 | 144,727,925 | 147,476,316 | 169,674,146 | 168,515,920 | 173,393,789 | 218,971,425 | 272,930,388 | 134,210,273 | 179,759,198 |
| පරිපාලන වියදම් | (1,255,752,763) | (1,151,711,425) | (1,189,348,793) | (1,033,810,083) | (1,142,902,688) | (773,676,196) | (1,151,207,809) | (601,403,438) | (1,395,814,503) | (718,018,736) |
| විකුණුම් සහ බෙදාහැරීම් පිරිවැය | (335,210,717) | (321,479,322) | (314,175,035) | (314,175,035) | (222,249,855) | (220,503,209) | (222,937,513) | (213,573,602) | (140,237,585) | (131,766,570) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබීම් | **414,360,027** | **388,371,344** | **557,662,005** | **424,787,602** | **547,098,247** | **440,826,385** | **665,580,269** | **611,415,245** | **495,426,698** | **449,896,734** |
| මූල්‍ය ආදායම | 217,808,170 | 213,907,634 | 154,451,475 | 145,235,138 | 168,766,491 | 150,007,977 | 282,598,968 | 210,668,182 | 445,958,333 | 316,507,931 |
| මූල්‍ය ගාස්තු | (22,154,752) | (17,532,829) | (27,890,447) | (17,589,492) | (16,207,048) | (8,789,218) | (22,135,246) | (6,263,475) | (26,342,723) | (9,753,126) |
| ශුද්ධ මූල්‍යආදායම | 195,653,418 | 196,374,805 | 126,561,028 | 127,645,646 | 152,559,443 | 141,218,758 | 260,463,722 | 204,404,707 | 419,615,611 | 306,754,804 |
| ආදායම් බදු පෙර ලාභය | **610,013,445** | **584,746,149** | **684,223,033** | **552,433,247** | **699,657,690** | **582,045,143** | **926,043,990** | **815,819,952** | **915,042,308** | **756,651,538** |
| ආදායම් බදු | (267,791,716) | (256,524,029) | (271,949,391) | (243,267,389) | (287,358,436) | (250,935,705) | (401,823,227) | (376,156,549) | (392,859,134) | (355,346,282) |
| වර්ෂය සඳහා ලාභය | **342,221,729** | **328,222,120** | **412,273,642** | **309,165,858** | **412,299,253** | **331,109,438** | **524,220,763** | **439,663,403** | **522,183,174** | **401,305,256** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | 13,927,098 | 13,927,098 | 20,297,204 | 20,282,110 | (6,529,540) | (5,919,064) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | 342,221,729 | 328,222,120 | 412,273,642 | 309,165,858 | 426,226,351 | 345,036,536 | 544,517,967 | 459,945,513 | 515,653,634 | 395,386,192 |

# සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශනය

## ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය

මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා | සමූහය | ඉකාපිමඋකා |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වත්කම් | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | | | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 3,362,855,558 | 3,134,280,527 | 3,298,246,727 | 2,896,020,996 | 3,088,678,195 | 2,686,829,682 | 2,905,911,035 | 2,509,023,699 | 2,852,702,138 | 2,372,710,383 |
| ආයෝජන | 38,326,397 | 38,326,417 | 34,521,663 | 44,521,683 | 39,477,863 | 44,253,587 | 38,489,824 | 46,957,402 | 51,117,849 | 61,117,869 |
| **මුළු ජංගම නොවන වත්කම්** | **3,401,181,955** | **3,172,606,944** | **3,332,768,390** | **2,940,542,679** | **3,128,156,058** | **2,731,083,269** | **2,944,400,859** | **2,555,981,101** | **2,903,819,987** | **2,433,828,252** |
| ජංගම වත්කම් | | | | | | | | | | |
| ඉන්වෙන්ටරි | 746,822,316 | 414,331,509 | 661,739,053 | 320,879,617 | 594,682,065 | 92,491,334 | 785,057,154 | 16,857,933 | 832,849,205 | **10,638,501** |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 13,034,273,723 | 9,465,446,814 | 8,582,269,469 | 9,581,357,319 | 8,937,778,990 | 9,443,009,084 | 11,485,838,621 | 11,013,443,138 | 14,779,002,414 | **14,400,921,345** |
| කෙටි කාලීන ආයෝජන | 1,769,259,420 | 1,728,581,897 | 2,753,124,096 | 2,457,313,968 | 3,341,850,862 | 2,570,978,949 | 4,081,356,846 | 3,035,639,354 | 4,094,534,947 | **2,983,463,922** |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 399,435,851 | 310,353,679 | 620,947,793 | 449,363,357 | 801,392,970 | 622,427,835 | 648,439,480 | 440,730,586 | 691,640,433 | **461,781,166** |
| අන්තර් සමාගම් ජංගම ගිණුම් | - | 1,083,035,301 | - | 1,278,026,970 | - | 1,147,466,029 | - | 1,371,069,905 | - | **1,565,621,738** |
| **මුළු ජංගම වත්කම්** | **15,949,791,310** | **13,001,749,200** | **12,618,080,411** | **14,086,941,231** | **13,675,704,887** | **13,876,373,232** | **17,000,692,101** | **15,877,740,916** | **20,398,026,998** | **19,422,426,671** |
| **මුළු වත්කම්** | **19,350,973,265** | **16,174,356,144** | **15,950,848,801** | **17,027,483,910** | **16,803,860,945** | **16,607,456,501** | **19,945,092,960** | **18,433,722,017** | **23,301,846,985** | **21,856,254,923** |
| සමකොටස් සහ බැරකම් | | | | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 |
| ප්‍රාග්ධන සංචිත | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 |
| රඳවාගත් ඉපැයීම් | 4,113,976,942 | 4,090,165,425 | 4,526,250,584 | 4,399,331,283 | 4,952,476,935 | 4,744,367,819 | 5,496,994,903 | 5,204,313,332 | 6,012,648,538 | 5,599,699,524 |
| **මුළු සමකොටස්** | **4,117,504,942** | **4,093,693,425** | **4,529,778,584** | **4,402,859,283** | **4,956,004,935** | **4,747,895,819** | **5,500,522,903** | **5,207,841,332** | **6,016,176,538** | **5,603,227,524** |
| ජංගම නොවන බැරකම් | | | | | | | | | | |
| කල් බදු ණය හිමියන් | 7,199,960 | 604,418 | 888,699 | - | - | - | - | - | **-** | **-** |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 204,004,898 | 204,004,898 | 182,165,317 | 182,165,317 | 177,457,833 | 176,438,911 | 158,063,895 | 156,587,664 | 165,820,347 | 161,242,343 |
| විලම්භිත බදු | 228,141 | - | 6,477,006 | - | 17,617,814 | - | 21,820,955 | - | 22,581,183 | - |
| **මුළු ජංගම නොවන බැරකම්** | **211,432,999** | **204,609,316** | **189,531,022** | **182,165,317** | **195,075,647** | **176,438,911** | **179,884,851** | **156,587,664** | **188,401,530** | **161,242,343** |
| ජංගම බැරකම් | | | | | | | | | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 14,451,694,061 | 11,333,291,954 | 10,485,704,301 | 11,724,834,406 | 10,877,454,823 | 10,931,756,058 | 13,293,081,842 | 12,120,903,654 | 16,124,875,069 | 15,156,893,565 |
| ගෙවිය යුතු ආදායම් බදු | 546,972,887 | 531,111,429 | 737,897,410 | 717,039,064 | 774,441,715 | 751,365,709 | 971,603,364 | 948,389,368 | 972,393,849 | 934,891,491 |
| කල් බදු ණය හිමියන් | 23,368,376 | 11,650,020 | 7,937,483 | 585,840 | 883,827 | **-** | - | - | - | - |
| **මුළු ජංගම බැරකම්** | **15,022,035,324** | **11,876,053,403** | **11,231,539,196** | **12,442,459,310** | **11,652,780,363** | **11,683,121,770** | **14,264,685,206** | **13,069,293,022** | **17,097,268,918** | **16,091,785,056** |
| **මුළු බැරකම්** | **15,233,468,323** | **12,080,662,719** | **11,421,070,218** | **12,624,624,627** | **11,847,856,010** | **11,859,560,681** | **14,444,570,057** | **13,225,880,686** | **17,285,670,447** | **16,253,027,399** |
| **මුළු සමකොටස් සහ බැරකම්** | **19,350,973,265** | **16,174,356,144** | **15,950,848,801** | **17,027,483,910** | **16,803,860,945** | **16,607,456,501** | **19,945,092,960** | **18,433,722,017** | **23,301,846,985** | **21,856,254,923** |

***වරහන් තුළ ඇත් අගයන්ගෙන් අඩු කිරීම් පෙන්නුම් කෙරේ***

# ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය

## අපගේ පසුබිම

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (මඉඋකා) ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහු-විෂය ඉංජිනේරු උපදේශන සේවා සැපයීම සඳහා 1973 අප්‍රේල් මස 12 වැනි දින පිහිටුවන ලදී. එය 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

ජාතික ඉංජිනේරු උපදේශන සහ ඉදිකිරීම් විශිෂ්ටත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පිළිගත් ව්‍යාපාර සන්නාමයක් වන මඉඋකා රජය සතු, වාණිජමය වශයෙන් සාර්ථක, ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස වර්ෂ 42ක දීර්ඝ කාලීන ශක්තිමත් ඉංජිනේරුමය කාර්ය සාධනයක් සනිටුහන් කරයි. අතිවිශාල බහුකාර්ය මහවැලි සංවර්ධන යටිතලව්‍යුහ ව්‍යාපෘතිය තුළ ශක්තිමත්ව මුල්බැස ගත් අපගේ ඉංජිනේරුමය මූලයන් එතැන් පටන් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි විවිධාංගීකරණය වූ සමාජ සහ ආර්ථික යටිතලව්‍යුහයන් සමූහයකට ඉංජිනේරුමය විශිෂ්ටත්වය එක් කිරීම සඳහා පුළුල්වීම සහ වර්ධනය වීම සිදු විය.

අපගේ ඒකාබද්ධ ශක්තීන් සහ දක්ෂතාවන් මඟින් වේලි, උමං මාර්ග, ජලවිදුලි ඉංජිනේරු කාර්යයන් ( ශ්‍රී ලංකාව/නැගෙනහිර අප්‍රිකාව), වාරිමාර්ග, ජල සැපයුම්/ සනීපාරක්ෂක සහ පාරිසරික ඉංජිනේරු කාර්යයන්, මහාමාර්ග, පාලම්, දුම්රිය මාර්ග, ගුවන් තොටුපළ, මහල් ගොඩනැගිලි, ගොඩනැගිලි සහ නාගරික යටිතල පහසුකම්, විශ්වවිද්‍යාල, පරීක්ෂණාගාර, සෞඛ්‍ය ආරක්ෂණ, වෙරළ සහ සාගර, ආරක්ෂක ව්‍යුහයන්, විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල ආදිය ආවරණය වේ. තවද අපගේ ප්‍රවීණතා පරාසය මඟින් පාරිසරික අධ්‍යයන, ස්වභාවික සම්පත් කළමනාකරණය, නැවත පදිංචි කිරීම්වල සමාජ ආර්ථික අංශයන්, ප්‍රජා සංවර්ධන, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ජාල (තසත) ආදියද ආවරණය කරනු ලැබේ. සත්‍ය වශයෙන්ම එක් ආයතනයකින් සියලු ඉංජිනේරුමය සැලසුම්, උපදේශන සහ ඉදිකිරීම අවශ්‍යතා සපුරාලනු ලබන්නේ නම් ඒ අප ආයතනයයි.

පශ්චාත් ගැටුම් කාල සීමාවේ වෙනස්කම් සහ අපගේ ජනතාවගේ අභිලාශයන් උදෙසා වන අපගේ ජාතික බැඳීම් අප විසින් අඛණ්ඩව සපුරා ඇත. අප අපගේ ස්වර්ණ ජයන්තිය ආසන්නයේ සිටින බැවින් කර්මාන්තයේ වඩාත් ශක්තිමත් ස්ථානයක් අත්පත් කරගෙන ඇත. ආකර්ෂණීය රාජ්‍ය සහ පෞද්ගලික යටිතලව්‍යුහ සහ උපයෝගීතා නිර්මාණය කරමින් පරිසරය ආරක්ෂා කිරීමේ අනාගත ජාතික අභියෝගයන්ට මුහුණු දීම සඳහා මඉඋකා එහි පුහුණු බහුවිෂය විශේෂයන් සහ උසස් ඉංජිනේරුමය දක්ෂතාවයන් සමඟින් එහි ප්‍රයත්නයන් දෙගුණ කරනු ඇත.

## මෙතෙක් පැමිණි ගමන

- ජල සම්පත් සහ ජල විදුලි ව්‍යාපෘති සඳහා විශේෂඥයන් ලෙස අපගේ ගමන් මඟ 1973 වර්ෂයේදී ආරම්භ කරන ලදී.
- මහවැලි කඩිනම් ව්‍යාපාරය අවසන් කිරීමෙන් පසුව අප ඉදිකිරීම් උපදේශන අංශය කරා විවිධාංගීකරණය විය.
- මානව ප්‍රාග්ධනය සඳහා අන්තර්ජාතික ප්‍රවේශයක් ලබා දෙමින් විදේශ ව්‍යාපෘති සිදු කිරීම සඳහා මඉඋකා තවදුරටත් පුළුල් වීම සිදු විය.
- 2016 වර්ෂයේදී ඉදිකිරීම් ව්‍යාපාරයෙන් ඉවත් වීමට උපාය මාර්ගික තීරණයක් ගත් මඉඋකා එම කටයුතු පූර්ණ අයිතිය සතු මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමට (මඉසේස) පැවරීමට කටයුතු කර කරන ලදී.
- වර්තමානයේදී, මඉඋකා රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවාදායකයන් සඳහා අංග සම්පූර්ණ ඉංජිනේරු උපදේශන සහ සම්බන්ධිත සේවා සපයන්නෙක් ලෙස ක්‍රියා කරනු ලැබේ.

## ප්‍රධාන අංශ



## 2017 වර්ෂයේ විශේෂතා

**2017 දෙසැම්බර් මස අවසානය දක්වා ලබා ගත් ජයග්‍රහණ - උපදේශන අංශය**

| 2017 වර්ෂයේ භාරගන්නා ලද නව උපදේශන ව්‍යාපෘති සංඛ්‍යාව - 83 | 2016 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද උපදේශන ව්‍යාපෘති සංඛ්‍යාව - 238 |
|---|---|
| උපදේශන සේවාවල මුළු වටිනාකම | උපදේශන සේවාවල මුළු වටිනාකම |
| ශ්‍රීලරු. මිලියන 1,574 | ශ්‍රීලරු. මිලියන 1,381 |

### අගුණකොලපැලැස්ස යෝජිත බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු. මිලියන 3,300 | ශ්‍රීලරු. මිලියන 159 | සම්පූර්ණ කර ඇත |



### මාතර - කතරගම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු. බිලියන 40 | ශ්‍රීලරු. මිලියන 645 | 80% |



**දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම- මාතර සිට බෙලිඅත්ත දක්වා සහ මාතර සිට හම්බන්තොට දක්වා**

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු: බිලියන 255 | ශ්‍රීලරු: මිලියන 280 | 55% |





**අකුරගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (DHQC)**

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු: බිලියන 43 | ශ්‍රීලරු: මිලියන 1,557 | 77% |





## බ්‍රෝඩ්ලෑන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 11,480 | ශ්‍රීලරු මිලියන 697 | 44% |



## කළු ගඟ ප්‍රධාන කාර්යයන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 12,000 | ශ්‍රීලරු මිලියන 700 | 85% |



### කොළඹ දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිලි සංකීර්ණය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 2,515 | ශ්‍රීලරු මිලියන 88 | 65% |





### පොලොන්නරුව ප්‍රදේශයේ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම.

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 81 | ශ්‍රීලරු මිලියන 16 | සම්පූර්ණ කර ඇත |





## පොලොන්නරුව ප්‍රදේශයේ ජාතික පාසලක් ඉදිකිරීම - අදියර 1

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු. මිලියන 8.5 | ශ්‍රීලරු. මිලියන 8.5 | 99% |





## මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 2

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු. බිලියන 137 | ශ්‍රීලරු. මිලියන 280 | 13% |



## කොළඹ 03 AVIC නේවාසික ව්‍යාපෘතිය ඉදිකිරීම



| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු බිලියන 25 | ශ්‍රීලරු මිලියන 148 | සම්පූර්ණ කර ඇත |

## මැනිං වෙළඳපොළ පෑලියගොඩ ප්‍රදේශයට ගෙන යෑම



| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 4000 | ශ්‍රීලරු මිලියන 218 | 58% |

## උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 71,400 | ශ්‍රීලරු මිලියන 232 | 52% |



### ත්‍රිකුණාමලය නාවුක තටාකාංගනයෙහි ජැටියක් නිර්මාණය කිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 3,000 | ශ්‍රීලරු මිලියන 12 | 80% |

### නීතිපති දෙපාර්තමේන්තුව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 900 | ශ්‍රීලරු මිලියන 55 | 33% |

### මුල්ලේරියාව රෝහලේ ජාතික ආඝාත මධ්‍යස්ථාන ගොඩනැගිලි සංකීර්ණය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | උපදේශනවල මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ශ්‍රීලරු මිලියන 1,220 | ශ්‍රීලරු මිලියන 40 | 55% |

## 2017 දෙසැම්බර් අවසානය දක්වා ලබා ගත් ජයග්‍රහණ - ඉදිකිරීම් අංශය

| 2017 වර්ෂයේදී භාරගත් නව ඉදිකිරීම් (නිර්මාණ සහ ඉදිකිරීම් පදනමින්) ව්‍යාපෘති සංඛ්‍යාව - 107 | 2017 වර්ෂයේදී භාරගත් නව ඉදිකිරීම් (නිර්මාණ සහ ඉදිකිරීම් පදනමින්) ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| ව්‍යාපෘතිවල මුළු ඉදිකිරීම් වටිනාකම | ව්‍යාපෘතිවල මුළු උපදේශන වටිනාකම |
| ශ්‍රීලරු. මිලියන 7,387 | ශ්‍රීලරු. මිලියන 11,598 |

### මොරාන ජලාශය ඉදකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු. මිලියන 1210 | 82% |

### රාගම, උතුරු කොළඹ ශික්ෂණ රෝහලෙහි හදිසි අනතුරු සේවා, ශල්‍යාගාර සංකීර්ණ, දැඩි සත්කාර ඒකක සහ වාට්ටු සඳහා යෝජිත ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම - අදියර III (අවසන් කිරීමේ)

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු. මිලියන 1,005 | 75% |

### බත්තරමුල්ල ජාතික පරිසර මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු. මිලියන 1,126 | සම්පූර්ණ කර ඇත |



### සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කොළඹ

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු මිලියන 5,199 | 19% |





### කරාපිටිය ශික්ෂණ රෝහලේ යෝජිත වෘක්කවේද, රුධිර කාන්දු පෙරන සහ බද්ධ කිරීමේ ඒකකය ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු මිලියන 790 | 42% |

### යාපනය ශික්ෂණ රෝහලේ අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු මිලියන 501 | 67% |

### මඩකලපුව ශික්ෂණ රෝහලේ අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු මිලියන 773 | 49% |

### මහනුවර ශික්ෂණ රෝහලේ යෝජිත පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානය - අදියර II ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු මිලියන 1,279 | 8% |

## කුරුණෑගල මහ රෝහලේ ගැබිණි මව්වරුන් සඳහා වාට්ටුවක් ඉදිකිරීම (අදියර - III)

ව්‍යාපෘතියේ මුළු වටිනාකම

ශ්‍රීලරු

මිලියන 915

භෞතික ප්‍රගතිය

41%



---

## පොලොන්නරුව යෝජිත කෞතුකාගාරය ඉදිකිරීම - අදියර 1

ව්‍යාපෘතියේ මුළු වටිනාකම

ශ්‍රීලරු

මිලියන 167

භෞතික ප්‍රගතිය

සම්පූර්ණ කර ඇත



### කැලණිය විද්‍යාලංකාර පිරිවෙනෙහි විද්‍යාලංකාර අන්තර්ජාතික බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු: මිලියන 685 | 73% |



### යාපනය යෝජිත බන්ධනාගාර සංකීර්ණය - 2 වැනි අදියර

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු: මිලියන 447 | 34% |

### පොලොන්නරුව නව නගරයේ යෝජිත පරිපාලන සංකීර්ණය සැලසුම් කිරීම සහ ඉදිකිරීම

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු: මිලියන 1,304 | 20% |

### පොලොන්නරුව නව නගරයේ යෝජිත රජයේ සේවක නිල නිවාස සංකීර්ණය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු: මිලියන 1,737 | 14% |

### රත්නපුර ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා සංකීර්ණය

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු: මිලියන 406 | 70% |

### පොලොන්නරුව දිස්ත්‍රික්කයේ යෝජිත මාර්ග ව්‍යාපෘති ඉදිකිරීම - පැකේජය 1

| ව්‍යාපෘතියේ මුළු වටිනාකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| ශ්‍රීලරු: මිලියන 1,828 | 95% |

# ඉකාමඋකා මූල්‍ය කාර්ය සාධනය

කාර්යාංශය, බහු-කාර්ය ඉංජිනේරු ශිල්පයේ රාජ්‍ය අංශයේ වෙනසක් ඇති කරවන ආයතනයක් බවට පත් වන බව පෙනෙන්නට තිබෙන අතර, රජය වෙනුවෙන් ඉක්මන් පදනමක් මත ඕනෑම අවදානම් සහගත තත්ත්වයක් හැසිරවීමේ හැකියාව සහ ධාරිතාවය සහිත රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස සන්නාමගත වී ඇත. වෙනත් වචනවලින් කිවහොත් එය බහු-විෂය වෘත්තිකයන් හා විවිධ ඉංජිනේරු ශිල්පයන් නියෝජනය කරනු ලබන තාක්ෂණික කාර්ය මණ්ඩලයකින් සමන්විත ශක්තිමත් මානව සම්පත් පදනමක් ඇති එකම රාජ්‍ය අංශ ඉංජිනේරු ආයතනය වේ. ආයතනයක් ලෙස "ඉංජිනේරුමය විසඳුම්" ඉක්මවා සිතා බැලීමට අපේ ආයතනය පුහුණු කර ඇති අතර සේවා සඳහා කැපවූ ප්‍රතිඵල අරමුණු කරගත් කණ්ඩායමක් වශයෙන් මඉඋකා ක්‍රියා කරයි. කණ්ඩායම ප්‍රධාන කණ්ඩායම් දෙකකින් සමන්විත වේ, එනම් තාක්ෂණික/ඉංජිනේරු කාර්ය මණ්ඩලය හා තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය වශයෙනි. කාර්ය මණ්ඩලය, ඔවුන්ගේ ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් හා නිපුණතාවයන්ගෙන් සමන්විත තාක්ෂණික, අතුරු තාක්ෂණික සහ ලේඛක කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩල කණ්ඩායම්වලින් සහාය ලබයි.

පසුගිය වර්ෂයේ ආදායමට වඩා 30%ක වැඩි වීමක් පිළිබිඹු කරමින් 2017 වර්ෂයේ ඉකාමඋකා සමූහයේ ආදායම රු.බිලියන 15.2ක් විය. මඉඋකාට පැවරුණු සියලු ඉදිකිරීම් කාර්යයන් පූර්ණ අයිතිය සතු අනුබද්ධිත සමාගම වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමට (මඉසේස) පැවරීම හේතුවෙන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී ඉකාමඋකා හි ආදායම 28%කින් වැඩි වූ අතර දළ ලාභය 3%කින් අඩු විය.

ඉකාමඋකා සහ සමූහය සඳහා පිළිවෙළින් පසුගිය වර්ෂයේ බදු පෙර ලාභය වන රු.මිලියන 816 සහ රු.මිලියන 926 හා සැසඳීමේදී ඉකාමඋකා සහ සමූහයේ මෙහෙයුම්වලින් ලත් 2017 වර්ෂයේ බදු පෙර ලාභය පිළිවෙළින් රු.මිලියන 757ක් සහ රු.මිලියන 913ක් විය. ඉකාමඋකා එහි ලාභය 1%කින් ඉහළ නංවාගෙන ඇති අතර සමූහයේ ලාභය 5%කින් ඉහළ ගොස් ඇත. කාර්යාංශයේ මුළු වත්කම් වටිනාකම රු.මිලියන 21,857ක් වන අතර ලාභය, කාර්යාංශයේ මුළු වත්කම් වටිනාකමින් 2%ක් නියෝජනය කරයි.

රාජ්‍ය ව්‍යාපාර පාලනය වන මූල්‍ය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව කටයුතු කරනු ලබන ස්වයං ආදායම් උපයනු ලබන රාජ්‍ය ව්‍යවසායක් (ධෘ) ලෙස කාර්යාංශය මුහුණ දෙන ආයතනික බාධාවන් සැලකිල්ලට ගත් විට අත්පත් කරගෙන ඇති මෙහෙයුම් හා මූල්‍ය කාර්ය සාධනය වඩාත් වැදගත් වේ.






## ගෝලීය සහ දේශීය රූපාකාරය




## ඉකාපිමඋකා ප්‍රාදේශිය හා කලාපීය ව්‍යාපෘති කාර්යාල



# විශේෂිත ක්ෂේත්‍ර සහ සේවාවන්







- ගොඩනැගිලි සේවා
- රෝහල් සංවර්ධන
- ගෘහනිර්මාණාත්මක සේවාවන්
- ව්‍යුහාත්මක සැලසුම්
- ප්‍රමාණ සමීක්ෂණ
- මාර්ග සහ පාලම්
- දුම්රිය මාර්ග කාර්යයන්
- වරාය/වෙරළ කාර්යයන්
- "ගුවන්තොටුපොළ සංවර්ධන
- ජල සම්පාදන සහ ජලාපවාහන"
- ජල විදුලි සහ බලශක්ති
- විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම්
- ජල සම්පත් සංවර්ධන
- තාක්ෂණ විගණන/වේලි ආරක්ෂණ
- විදුලි මහ යාන්ත්‍රික කාර්යයන්
- ඉඩම් මැනීම
- තොරතුරු තාක්ෂණ (IT)
- පාරිසරික අධ්‍යයන
- ව්‍යාපෘති කළමනාකරණ
- භූ තාක්ෂණික විමර්ශන සහ පරීක්ෂණාගාර සේවාවන්












# මානව සම්පත්

### මානව ප්‍රාග්ධනය

ඉකාමඋකා තමන් සතුව පවතින විවිධාකාර කුසලතා සමූහය, කර්මාන්ත අත්දැකීම් සහ කුසලතාවන්ගෙන් ප්‍රතිලාභ ලබන අතර එමඟින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සේවාදායකයන්ට බහුවිෂය ඉංජිනේරුමය සේවාවන් සැපයීමට කාර්යාංශය සමත් වේ.

කාර්යාංශයේ මානව ප්‍රාග්ධනය, එහි උපයා ගැනීමේ හැකියාව, ඵලදායීතාවය සහ දිගුකාලීන තිරසාර පැවැත්මේ මූලික අංගයක් ලෙස සැලකේ. ආයතනික යහපාලනයෙහි මූලධර්ම පිළිපැදීම සඳහා ඔවුන් උන්නඳු කරවීම සහ බලාත්මක කරවීම සිදු කර ඇති බැවින් සේවකයින් ඒ සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දෙයි.

### මානව ප්‍රාග්ධන සාරාංශය




| | ස්ථිර | කොන්ත්‍රාත්තු | රැකියා කොන්ත්‍රාත්තු | එකතුව |
|---|---|---|---|---|
| තාක්ශනික | 707 | 161 | 163 | 1031 |
| තාක්ශනික නොවන | 248 | 39 | 78 | 365 |

### වයස අනුව වෙන් කිරීම



## පාලනය

මානව සම්පත් ඒකකය සාමාන්‍යාධිකාරී වෙත වාර්තා කරනු ලබන අතර අවශ්‍ය නියාමන අනුකූලතාවයන් සහතික කරන අතරම කාර්යාංශයේ ව්‍යාපාරික අවශ්‍යතාවයන්ට සහාය දක්වන විස්තීර්ණ මානව සම්පත් රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින් කාර්යාංශය පුරාවට යහ භාවිතයන් ප්‍රචලිත කිරීම සඳහා වගකීම දරයි. නියාමන ශක්තිමත් කිරීම සඳහා සහ කාර්යාංශය හා එහි සේවකයින් අතර විධිමත් අන්තර් ක්‍රියාකාරීත්වයකට පහසුකම් සැපයීම සඳහා විධිමත් ප්‍රතිපත්ති රාමුවක් ක්‍රියාත්මක වේ. නියාමන අවශ්‍යතා සපුරාලීම අභ්‍යන්තර විගණන හා රැස්වීම් මගින් තහවුරු කරනු ලැබේ.

පසුගිය වසරවලදී යහපත් මානව සම්පත් භාවිතයන් ශක්තිමත් කිරීම සඳහා කාර්යාංශය මානව සම්පත් කේන්ද්‍රගත කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලද අතර, එයට අමතරව කාර්යාංශයේ අදාළ පද්ධතිවල සුමට ක්‍රියාකාරීත්වය පහසු කිරීම සඳහා මානව සම්පත් තොරතුරු පද්ධතියක් හඳුන්වා දෙන ලදී.

කාර්යාංශය එහි සේවකයන්ට ආරක්ෂිත, සුරක්ෂිත සහ හිතකර පරිසරයක් සපයයි. සේවකයින්ට සංගම් පිහිටුවා ගැනීමේ නිදහස ලබා දී ඇති අතර බාල වයස් ශ්‍රමය, බලහත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය පදනම් කරගත් කවර හෝ වෙනස්කමක් සිදු කිරීම තහනම් කර ඇත.

කාර්යාංශයේ සම්පත්වලට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබන ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුම, එහි මානව ප්‍රාග්ධනය කාර්යාංශයට අඛණ්ඩව අභියෝගයක් වී ඇති අතර සේවකයන් රඳවා තබා ගැනීම ඉහළ නැංවීම සඳහා කාර්යසාධනය පදනම් කරගත් දිරිගැන්වීම් වැනි අවම කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත.



## පාරිතෝෂික සහ පාරිශ්‍රමික

සේවක ගෙවීම්වලට වැටුප්, දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ අයත් වේ. ඵලදායීතාව මැනීමෙන් කාර්යාංශයේ වර්ධන හා ලාභදායි අරමුණු සඳහා එහි සේවකයන් කොපමණ ප්‍රමාණයකින් දායකත්වය දක්වන්නේදැයි ඵලදායීව හඳුනාගැනීමට කාර්යාංශයට හැකියාව ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද සාධාරණ වන්දි ගෙවීමේ පැකේජයක් කාර්යාංශ විසින් සිය කාර්ය මණ්ඩලය වෙත සපයන අතර සේවක අර්ථසාධක අරමුදල (**EPF**) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (**ETF**) වැනි අර්ථදැක්වූ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා දායකත්වය සපයයි.

## පුහුණු සහ සංවර්ධන

සේවා ආයතනයක් ලෙස, ඉකාමඋකා එහි මානව සම්පත් කාර්යාංශයේ "හදවත" ලෙස සලකනු ලබන අතර ඉකාමඋකා කාර්ය මණ්ඩලයෙහි දැනුම, කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා පුහුණු හා සංවර්ධනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කාර්යාංශයේ පුහුණු හා සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා 2000 වර්ෂයේදී වෙනම අංශයක් පිහිටුවන ලදී.

එහි සියලුම අංශවල සේවකයින්ට අදාළ පුහුණු හා සංවර්ධන සැපයීම සඳහා ඉකාමඋකා නිරතුරුවම කැපවී සිටී. දැනුම ඉහළ නැංවීම සහ නව දැනුම, කුසලතාවයන් සහ ආකල්ප අත්පත් කර ගැනීම තුළින් ඔවුන්ගේ රාජකාරිවල කාර්ය සාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සේවකයන්ට සහාය වීමෙන් පුහුණු හා සංවර්ධනය එහි මානව සම්පත් පුහුණු කිරීම උදෙසා වන කාර්යාංශයේ ක්‍රමික ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කරනු ඇති අතර එමගින් අනෙක් අතට ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කාර්යාංශයේ කාර්ය සාධනය සහ කීර්තිය වැඩිදියුණු කරනු ඇත.

ඉහත අරමුණු සපුරා ගැනීම පිණිස ඉකාමඋකා සිය සේවකයින්ට පහත දක්වා ඇති විවිධ වැඩසටහන් / පහසුකම් සලසයි:

- ආචාර්ය උපාධි, විද්‍යාපති සහ පශ්චාත් උපාධි වැඩසටහන්
- විදේශ පුහුණුව
- ඩිප්ලෝමා වැඩසටහන්
- වෘත්තීය සංවර්ධන පාඨමාලා පවත්වාගෙන යෑම
- සහතිකපත්‍ර පාඨමාලා
- දේශන/සම්මන්ත්‍රණ, වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා
- වෘත්තීය සමාලෝචන පරීක්ෂණ
- ආයතනය තුළ දැනුම බෙදාහදා ගැනීමේ වැඩසටහන් (ඉදිරිපත් කිරීම්)
- ඉකාමඋකා පුහුණු ඒකකය විසින් සංවිධානය කරන ලද අයතනය තුළ පවත්වන පුහුණු වැඩසටහන්.

ජාතික කාර්යභාරය ලෙස කාර්යාංශය විසින් ජාතික විශ්වවිද්‍යාල, ජාතික ඩිප්ලෝමා ප්‍රදානය කරනු ලබන ආයතන, කාර්මික විද්‍යාල සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (ඔඩෘක) විසින් සහතික කර ඇති තාක්ෂණික පාඨමාලා පවත්වාගෙන යන අනෙකුත් ආයතනවල ශිෂ්‍යයන් සඳහා කාර්මික යන්ත්‍රාගාර පුහුණුව සපයනු ලැබේ. මෙම ආයතනවල ශිෂ්‍යයන්ට තමන්ගේ විෂයට අදාළව ඉංජිනේරු/ තාක්ෂණික පුහුණුව ලබා ගැනීම සඳහා ඉකාමඋකා පහසුකම් සපයන අතර විශේෂඥ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන්ගේ මඟපෙන්වීම යටතේ කර්මාන්තයේ නවීන තාක්ෂණයන් පිළිබඳව අවබෝධයක් ලබා දෙනු ලැබේ. එවැනි පුහුණු වැඩසටහන් මඟින් කාර්යාංශයට මෙන්ම ශිෂ්‍යයන්ටද ප්‍රතිලාභ හිමි වේ.

### පුහුණු ඒකකයේ වගකීම්

සුදුසු පුහුණු සහ ඉගෙනුම් සංවර්ධන අවස්ථාවන් හඳුනාගැනීම සඳහා පුහුණු ඒකකය සේවකයන්ට සහාය වේ.

පුහුණු ඒකකය පහත කරුණු සඳහා වගකිව යුතු වේ:

- කාර්යාංශය සඳහා වාර්ෂිකව පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම.
- පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයී පදනම් කර ගනිමින් පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මඟ පෙන්වීම සහ සමාලෝචනය කිරීම.
- සියලු සේවකයන් සඳහා සුදුසු පුහුණු වැඩසටහන් පවතින බව සහතික කිරීම.
- සේවකයන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම සහ ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථාවන් සැපයීම.
- ආයතනය තුළ පවත්වන පුහුණු ඉදිරිපත්කිරීම්වල අන්තර්ගතය වර්තමාන කර්මාන්ත ප්‍රමිතවලට සහ අවශ්‍යතාවලට මෙන්ම ඉකාමැටකා මෙහෙවර සමඟ අනුකූල වන බවට සහතික වීම.
- ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ ඉල්ලීම් අනුව උපාධි/ ඩිප්ලෝමා මට්ටම සඳහා කර්මාන්ත පුහුණු සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාවට නැංවීම
- පුහුණු සංඛ්‍යාලේඛන/වාර්තා සකස් කිරීම සහ සේවක වාර්තා පවත්වාගෙන යෑම.
- ලබාදුන් පුහුණුව, වියදම් කරන ලද අරමුදල් සහ කාර්යාංශයේ පුහුණු සහ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගනිමින් සිටින්නේ කෙසේද යන්න ඇතුළත් සංක්ෂිප්ත වාර්තා ඇතුළු වාර්තා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ලබා දීම.
- පුහුණු සංවර්ධන යෝජනා සකස් කිරීම සහ මෙහෙයුම් කමිටු අනුමැතිය සහිතව ඒවා ක්‍රියාවට නැංවීම.

කාර්යාංශයේ සියලු සේවකයන් පහත දක්වා ඇති පරිදි ප්‍රධාන කාණ්ඩ තුනකට වර්ගීකරණය කර ඇත:

- වෘත්තීමය සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලය
- තාක්ෂණ කාර්ය මණ්ඩලය
- තාක්ෂණ නොවන කාර්ය මණ්ඩලය

ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් ඉහත ඉලක්කගත කාණ්ඩවල සේවකයන් පුහුණුව ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

කාර්යාංශය හා එහි සේවකයින්ගේ අවශ්‍යතාවයන් සහ අභිමතාර්ථවලට අදාළව වන්නේද සහ එය වර්තමාන ගෝලීය ප්‍රවණතාවන්ට අනුකූල වන්නේද යන්න සහතික කිරීම සඳහා පුහුණු ප්‍රතිපත්තිය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. පුහුණු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් පුහුණු අංශය වගකීම දරයි. භාරගත් වැඩසටහන් සහ ක්‍රියාරකම්වල ඵලදායීතාවය නිශ්චය කර ගැනීම සඳහා සියලු සේවකයින්ගේ සහභාගිත්වයෙන් ආකල්ප සමීක්ෂණයක් සිදු කළ හැකිය. මෙම සමාලෝචනයේ කොටසක් ලෙස පුහුණු අංශය මඟින් පුහුණු සංඛ්‍යාලේනවලින් මෙන්ම කුසලතා විගණනවලින් දත්ත ලබා ගැනීම සහ විශ්ලේෂණය කිරීම සිදු කරනු ලැබේ. පුහුණු කිරීමේ ප්‍රතිපත්තිය කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අනුමැතියට යටත් වේ.

| අංකය | වැඩසටහන | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සහභාගිවූවන් සංඛ්‍යාව (ආසන්න වශයෙන්) | මුළු පිරිවැය (ආසන්න වශයෙන්) | සහභාගිවූවන් සංඛ්‍යාව (ආසන්න වශයෙන්) | මුළු පිරිවැය (ආසන්න වශයෙන්) | සහභාගිවූවන් සංඛ්‍යාව (ආසන්න වශයෙන්) | මුළු පිරිවැය (ආසන්න වශයෙන්) | සහභාගිවූවන් සංඛ්‍යාව (ආසන්න වශයෙන්) | මුළු පිරිවැය (ආසන්න වශයෙන්) |
| 1 | ලබා දුන් බාහිර වැඩසටහන් - දේශීය (වෘත්තීය සංවර්ධන පාඨමාලා, සහතිකපත්‍ර පාඨමාලා, දේශන/සම්මන්ත්‍රණ, වැඩමුළු පවත්වාගෙන යෑම, | 365 | 3,400,000.00 | 440 | 3,400,000.00 | 560 | 4,900,000.00 | 596 | 6,569,551.00 |
| 2 | විද්‍යාපති වැඩසටහන්/පශ්චාත් උපාධි වැඩසටහන් | 13 | 2,700,000.00 | 19 | 4,500,000.00 | 21 | 5,400,000.00 | 02 | 528,500.00 |
| 3 | ආයතනය තුළ පවත්වන ලද දැනුම බෙදාහදා ගැනීමේ වැඩසටහන් (ඉදිරිපත්කිරීම්) | 680 | 40,000.00 | 800 | 60,000.00 | 1100 | 70,000.00 | 785 | 40,000.00 |
| 4 | විදේශ පුහුණු වැඩසටහන් | 12 | 1,231,600.00 | 5 | Sponsored by the host country | - | - | 10 | 6720 $ + 525 € |
| 5 | ඉකාමඋකා පුහුණු ඒකකය විසින් සංවිධානය කරන ලද ආයතනය තුළ පවත්වන පුහුණු වැඩසටහන් | - | - | - | - | 600 | 450,000.00 | 834 | 723,770.00 |
| 6 | වෘත්තීය සමාලෝචන පරීක්ෂණ | 07 | | 32 | | 33 | | 18 | |
| 7 | **යන්ත්‍රාගාර පුහුණුව | 470 | | 440 | | 550 | | 602 | |
| 8 | බාහිර පුහුණු වැඩසටහන් | - | | - | | - | | 65 | 901,563.00 |
| 9 | ක්ෂේත්‍ර චාරිකා | - | | - | | - | | 32 | |

## සේවක ප්‍රතිලාභ සහ දුක්ගැනවිලි

සේවක සුබසාධනය ඉහළ නැංවීම සහ සාමාන්‍ය ජීවිතය සහ රාජකාරි ජීවිතය සමතුලිතව පවත්වාගෙන යෑම සඳහා වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. සේවකයින්ට තම දුක්ගැනවිලි ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කිරීමට ඉඩ සැලසීමේ ප්‍රතිපත්තියක් සහ ව්‍යුහයන් කාර්යාංශය විසින් පවත්වා ගෙන යනු ලැබේ. සේවකයින්ට සිය ගැටලු ආසන්න වාර්තාකරණ නිලධාරියා සමඟ සාකච්ඡා කර නිරාකරණය කර ගැනීමට අවස්ථාව පවතින අතර කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් මානව සම්පත් ඒකකයට හෝ අදාළ පාර්ශ්ව වෙත සෘජුව යොමු කිරීමටද ඔවුන්ට හැකි වේ.

## කර්මාන්ත සම්බන්ධතා

මානව සම්පත් ආකාරයන් ඕනෑම සේවකයෙකුට සෑම මට්ටමකටම කළමනාකරණයක් කරා ප්‍රවේශවීමේ හැකියාව ලබා දෙන ආකාරයෙන් සලකා බලනු ලැබේ. කාර්යාංශය තුළ පවතින සංස්කෘතිය මඟින් රාජකාරි කටයුතු සඳහා පමණක් නොව සේවකයන් විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතා සම්බන්ධයෙන්ද නිරන්තර සංවාදයක් සඳහා උනන්දු කරනු ලැබේ.

ඉකාමඋකා සිය සේවකයින්ගේ සංගමයේ නිදහසට ඇති අයිතිය පිළිගනී. එබැවින් ඔවුන්ගේ සාමාජිකයින් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාකාරී වෘත්තීය සමිති ක්‍රියාත්මක වේ. ඉකාමඋකා කළමනාකාරිත්වය, වෘත්තීය සමිති නියෝජිතයන් සමග ඉදිරියට යෑමේ පදනමක් මත ක්‍රියාකාරීව කටයුතු කරනු ලැබේ.



## මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම

**"ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (ඉකාමඋකා) පූර්ණ වශයෙන් අයත් අනුබද්ධිත ආයතනයක් වන මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (මඉසේස) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2003 වර්ෂයේ දෙසැම්බර් මස 16 වැනි දින සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2009 වර්ෂයේ නොවැම්බර් මස නැවත ලියාපදිංචි කර ඇත."**

මෙම කාලපරිච්ඡේදයේදී ඇති වූ විශාල පිබිදීමේ ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් සේවාවන් සඳහා වූ අධික ඉල්ලුම මඟින් ඇති කරන ලද අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් 2011 වර්ෂය ආරම්භයේදී මඉසේස ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාකාරීව මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉකාමඋකා සමඟ එක්ව කටයුතු කිරීම තුළින් ඉදිකිරීම් කළමනාකරණ සහ තාක්ෂණික දැනුම මෙන්ම එහි ව්‍යාපෘති කළමනාකරණ දැනුම් හැකියාවද ලබා ගනිමින් කර්මාන්තය විසින් පිරිනමන ලද අභියෝගය මඉසේස විසින් භාර ගන්නා ලදී. මඉසේසහි ප්‍රධාන ව්‍යාපාර වන්නේ ගොඩනැගිලි, මාර්ග, පාලම්, ජල සම්පාදන ව්‍යුහ ඉදිකිරීම සහ වෙනත් සම්බන්ධිත යටිතලව්‍යුහ ඉදිකිරීම වේ. සමාගම, එහි ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් සහ ඇස්ෆාල්ට් නිෂ්පාදනය කිරීමේද යෙදී සිටී.

මඉසේස රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශ සේවාදායකයන් සඳහාද සේවා සපයයි. සියලු ආකාරයේ ආයතනික ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාලයට සම්පූර්ණ කිරීම හේතුවෙන් මඉසේස රාජ්‍ය ආයතන, ව්‍යාපාරික ප්‍රමුඛයන් සහ පරිපාලකයින්ගේ විශ්වාසය දිනාගෙන ඇත. ඉකාමඋකා 1973 වැනි ඈත කාලයකදී උපදේශකවරුන් ලෙස ඉකාමඋකා පියස යටතේ මුලින්ම කර්මාන්තයට පිවිසීම තුළින් වර්තමානයේදී දැනුම් පදනමක් ලෙස ක්‍රියා කරන බොහෝ අත්දැකීම් ලබා ඇත. තවද ඉකාමඋකා හි **EPC** අංශය යටතේ ලබා ගන්නා ලද ඉදිකිරීම් අත්දැකීම් තිරසර ව්‍යාපාර වටපිටාවක් නිර්මාණය කර ඇත.

## අභිමතාර්ථ

- සියලු ක්‍රියාකාරී ක්ෂේත්‍ර සඳහා ඒකාබද්ධ සහ විනිවිදභාවයෙන් යුත් කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීම.
- අනන්‍ය තත්ත්ව, පරිසර, සෞඛ්‍ය සහ ආරක්ෂණ පද්ධතියක් පිහිටුවීම.
- විවිධාංගීකරණය කළ ආයෝජන මඟින් ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම.
- ඉදිකිරීම් කර්මාන්තයේ විශිෂ්ට මානව සම්පත් පදනමක් පවත්වා ගැනීම.
- ස්වාධීන ලාභ උපයන ආයතනයක් ලෙස මඉසේස හි වත්කම් ඵලදායීව කළමනාකරණය කිරීම.
- ප්‍රමාණවත් අත-ඇති වැඩ ප්‍රමාණයක් පවත්වා ගැනීම සහ ආයතනික තිරසරකත්වය සංවර්ධනය කිරීම.
- ඉදිකිරීම් පිරිවැය ප්‍රශස්ත කිරීම පිණිස නවීන තාක්ෂණය භාවිතයෙන් පද්ධති වැඩිදියුණු කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම.

## දැක්ම

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ අද්විතීය ආදර්ශයක් වීම

## මෙහෙවර

දායකත්වය ප්‍රමාණවත් ලෙස හඳුනාගන්නා ලද ඉහළ අභිප්‍රරණයක් සහිත කාර්ය මණ්ඩලයක් සමඟින් ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වය සහ නවෝපාදනය අත්පත් කර ගැනීම

# අධ්‍යක්ෂ මණ්ඩලය



**ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා**
**සභාපති**

BSc.Eng. (Hons), PG.Dip. (Const.Mgt), PG.Dip. (Ports & Coastal Eng.) Norway, MIE (SL), C.Eng., MASCE

**ඉංජි. එන්. රූපසිංහ මහතා**
**අධ්‍යක්ෂ**

BSc.Eng. (Hons), PG.Dip. (Hydropower) Norway, C.Eng., MIE (SL), MICE (London), Licd. Surveyor

**ඉංජි. ඒ. ගල්කැටිය මහතා**
**අධ්‍යක්ෂ**

BSc.Eng., C.Eng., MIE (SL)



**ඉංජි. කේ.එල්.එස්. සහබන්දු මහතා**
**අධ්‍යක්ෂ**

Bsc.Eng. (Hons), PG.Dip. (Hydro Eng.), MSC (Structural Eng.), C.Eng., MIE (SL), MICE (London), M Cons. E (SL), FSSE (SL)

Executive Director BOARD

**ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා**

**විධායක අධ්‍යක්ෂ**

BSc.Eng., C.Eng., MICE (UK), MIE (SL)

**එම්.ආර්. ජී. රණතුංග මහතා**

**අධ්‍යක්ෂ**

LLB (Sri Lanka), Attorney-at-Law, Notary Public, Company Secretary, Actg. Magistrate



**ඉංජි. ටී. ඩී. වික්‍රමරත්න මහතා**

**අධ්‍යක්ෂ**

BSc.Eng. (Hons), M.Eng. PG.Dip. (Hydrology), MICE (UK), FIE (SL), C.Eng.

**එච්.එම්.යූ.එන්.බී. මාවතගම මහතා**

**අධ්‍යක්ෂ**

CBA (ICASL), Dip in Acct, SAT



# මඉසේස විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති කිහිපයක්

**මඩකලපුව ශික්ෂණ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය**



**මඩකලපුව කලුතාවලයි හි ආර්ථික මධ්‍යස්ථානය**



**බත්තරමුල්ල රාජ්‍ය සේවා කොමිෂන් සභා ගොඩනැගිල්ල**



ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කල්ලාරව පිහිටි මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය




කල්මුනේ මූලික රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය



යාපනය විශ්වවිද්‍යාලය සඳහා උත්සවාකාර ඇතුල්වීමේ ව්‍යුහය



නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා ක්‍රීඩාගාරය පුළුල් කිරීම සහ ක්‍රීඩාංගන පහසුකම් - ඕලුවිල්



දිගන පළාත් මට්ටමේ ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රධාන ක්‍රීඩා මණ්ඩපය



කොතලාවල හුවමාරුවෙහි ගාස්තු ස්ථාන සහ ගාස්තු ගේට්ටු කාර්යාල ගොඩනැගිලි



කළුතර- නාගොඩ මහ රෝහල සඳහා හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය



මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා පිළිකා සංකීර්ණය අදියර II



පරිසර සහ මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සඳහා ජාතික පරිසර මහලේකම් කාර්යාලය




ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා සංකීර්ණය - රත්නපුර



2017
වාර්ෂික වාර්තාව

Designed by Zeon Lab Digital +94 77 9688569 www.zeonlabdigital.com



**ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය**
මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යංශය
නො 45 බෞද්ධාලෝක මාවත කොළඹ 7
Tel: +94 11 2668800 Fax : +94 11 2687369
Email: cecb@cecbsl.com
www.cecb.lk